# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report
# 2024



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
நகர குடியிருப்பு அபிவிருத்தி அதிகாரசபை
Urban Settlement Development Authority

# වාර්ෂික වාර්තාව

# 2024



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# අන්තර්ගතය


ආයතනික පාලන වාර්තාව ............................................................ 4
සභාපති සමාලෝචනය ............................................................ 5
අධ්‍යක්ෂ ජනරාල් සමාලෝචනය ............................................................ 6
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය ............................................................ 7
2024.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි නව අධ්‍යක්ෂ මණ්ඩලය ............................................................ 8
2024.01.01 දින සිට 2024.10.01 දින දක්වා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය ............................................................ 12
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය ............................................................ 17
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය 2024.01.01 – 2024.10.01 ............................................................ 18
උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය ............................................................ 19
විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය ............................................................ 20
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය ............................................................ 21
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන නිලධාරි මණ්ඩලය ............................................................ 22
භෞතික සංවර්ධන වැඩසටහන ............................................................ 24
2024 වර්ෂයේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ............................................................ 25
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘතින් හි නිවාස බැහැර කිරීම, සංවර්ධන කටයුතු හා පවරා ගැනීම ............................................................ 27
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘතියෙහි අලෙවිකිරීම සහ සංවර්ධන කටයුතු ............................................................ 29
ඉදිරි භෞතික ව්‍යාපෘතින් හි පරිසරය ආරක්ෂා කර ගැනීමට හා පරිසරය වෙනුවෙන් සෘණාත්මක බලපෑමක් ඇති කරන ක්‍රියාකාරකම් අවම කිරීමට ගෙන ඇති පියවර ............................................................ 29
නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට නිවාස හිමිකම් හා ඔප්පු ලබාදීම ............................................................ 30
අවදානම් තක්සේරු කිරීමේ හා අවම කිරීමේ උපාය මාර්ග ............................................................ 31
සමාජ සංවර්ධන වැඩසටහන ............................................................ 32
සමාජ සංවර්ධන වැඩසටහන 2024 ............................................................ 33
සමාජ සංවර්ධන වැඩසටහන ජනාවාසයන් තුළ ක්‍රියාත්මක කිරීම ............................................................ 34
2024 ලෝක ජනාවාස දිනය ............................................................ 49
ලෝක ජනාවාස ජාතික සැමරුම් උත්සවය - 2024 ............................................................ 53
ප්‍රදාන කාර්යය දර්ශක ............................................................ 54
නෛතික ක්‍රියාමාර්ග ගැනීම ............................................................ 56
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර ඉපයීම් (අයකිරීම්) ප්‍රගතිය ............................................................ 57
භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය ............................................................ 57
මානව සම්පත් සංවර්ධනය සහ ආයතන පරිපාලන කටයුතු ............................................................ 58
අධ්‍යාපන ණය ලබාදීම ............................................................ 59
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2024.12.31 දිනට කාර්යමණ්ඩල පිළිබඳ විස්තර ............................................................ 60
අවසන් ගිණුම් වාර්තාව ............................................................ 61
විගණකාධිපතිවරයාගේ වාර්තාව ............................................................ 91

# දැක්ම

***"සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසාර නාගරික ජනාවාස ගොඩනැගීම"***

# මෙහෙවර

***"සුසැදි, සංයුක්ත හා සුරැකි බව රැඳුනු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික, සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම"***

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ

- සෑම නාගරික ප්‍රදේශයක් සඳහාම සැලසුම් සහගත සංයුක්ත නාගරික ජනාවාස ඇති කිරීම
- නාගරික ප්‍රජාවන්ගේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය වැඩිදියුණු කිරීම
- නාගරික ප්‍රජාවන් තුළ දේපල හිමිකාරීත්වය පිළිබඳව හැඟීමක් ඇති කිරීම
- අධිකාරියෙහි කාර්ය සාධනය විශිෂ්ටත්වයට පත් කිරීම

# ආයතනික පාලන වාර්තාව



# සභාපති සමාලෝචනය



2008 අංක 36 දරන පනතින් ස්ථාපිත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නාගරික කලාපයන්හි ජීවත්වන අඩු හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නංවාලනු වස්, දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ පාදක කරගනිමින් භෞතික සංවර්ධන ව්‍යාපෘති හා සමාජ සංවර්ධන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.

2024 වර්ෂයේ අවසන් කාර්තුවේ දී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නව සභාපතිවරයා ලෙස පත්වීම් ලැබූ අතර, එහිදි ප්‍රධාන වශයෙන් අධිකාරියේ පැවති පරිපාලන ක්‍රමවේදය විධිමත් ක්‍රමවේදයකට සකස් කර ඒ තුළින් පුනරාවර්ථන වියදම් අවම කිරීම සහ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු සිදුකරන ලදී.

තවද **"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"** සබැඳි රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුගතව ඉදිරි වසර 05 සඳහා 2025-2029 උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඊට අදාළ අනුමැතීන් ලබාගැනීම සිදුකරන ලදී.

මේ තුළින් ඉදිරියේ දී මහ භාණ්ඩාගාරයට වැය බරක් නොවී ස්වයං උත්පාදිත ආයතනයක් බවට පත් කිරීම මුඛ්‍ය අරමුණ වන අතර, භෞතික සංවර්ධන වැඩසටහන යටතේ නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාවන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය නිවාස හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීම, ප්‍රමිතියෙන් තොර නිවාස ඒකක වැඩිදියුණු කිරීම සඳහා ඉඩම් හිමි නමුත් විධිමත් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි පුද්ගලයන්ට මූල්‍ය පහසුකම් සහ ඉදිකිරීම් උපදෙස් ලබාදීම සඳහා ව්‍යාපෘති සිදු කිරීම අපේක්ෂා කෙරේ.

එසේම මධ්‍ය ආදායම්ලාභීන් සඳහා රාජ්‍ය- පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය (PPP) යටතේ දීප ව්‍යාප්තව එක් දිස්ත්‍රික්කයක අවම වශයෙන් නිවාස ඒකක 100ක් ඉදිවන සේ ව්‍යාපෘති සිදුකිරීමට සැලසුම් කර ඇත. එහි ප්‍රථම අදියර වශයෙන් ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර, එම නිවාස ව්‍යාපෘතිවල මූලික අනුමැතින්, නිශ්කාෂන කටයුතු, ඉඩම් පවරා ගැනීම් හා අත්පත් කර ගැනීමේ කටයුතු ද සිදුකර ඇත. අධිකාරිය විසින් ජනතා අයිතියට පත්කර ඇති ලුනාව "සීච්ච් රෙසිඩන්සීස්" මහල් නිවාස ව්‍යාපෘතියේ ඔප්පු ලබාදීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සංශෝධනය කර හිමිකම් ඔප්පු කඩිනමින් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

සමාජ සංවර්ධන වැඩසටහන යටතේ නාගරික අඩු පහසුකම් ප්‍රජාවගේ සාමාජීය, ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ඔවුන්ව ස්වශක්තියෙන් යුතුව ඔසවා තැබීම සඳහා ප්‍රජා සවිබලකරණ වැඩසටහන, අධ්‍යාපන වැඩසටහන, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන හා සමාජ සංස්කෘතික වැඩසටහන යන උප වැඩසටහන් 04 මගින් නාගරික බල ප්‍රදේශ 279ක් තුළ දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරන ලදී. 2025 වර්ෂය තුළ නාගරික බල ප්‍රවේශ 100ක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
මීට අමතරව, අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත පුහුණු වැඩසටහන් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර ඒ තුළින් විෂය දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමටත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සේවයෙහි නියුතු වීමට අවශ්‍ය අභිප්‍රේරණය ලබාදීමට කටයුතු සිදුකිරීමටත් පියවර ගැනිණි.

අධිකාරියේ පනත මගින් පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීමට සියළු අභියෝගයන් හමුවේ නොසැලෙමින්, ශ්‍රී ලංකාවෙහි නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වය සමෘද්ධිමත්භාවය කරා ගෙනයාමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හරහා වගකීම් සහගතව උරදෙන බව සඳහන් කරමි.

**ජේ.එස්.ඩී.එම්.අසංක අබේවර්ධන**
**සභාපති**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ ජනරාල් සමාලෝචනය



2008 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, පනත ප්‍රකාරව නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාව වෙත භෞතික සංවර්ධන හා සමාජ සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමගින් ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම අධිකාරියෙහි මුඛ්‍ය අරමුණ වී ඇත.

අධිකාරියේ අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප) ධුරයේ රාජකාරි සිදුකරමින් අධිකාරියේ උපායමාර්ගික සැලසුම් සකස් කිරිම ඇතුලු ක්‍රමසම්පාදන ක්‍රියාවලියට දායක වූ මාහට 2024 නොවැම්බර් මස 19 වන දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්වීම් ලැබීම මා ලද මහත් භාග්‍යක් ලෙස සලකමි.

ඒ අනුව ''පෙහොසත් රටක් ලස්සන ජීවිතයක් '' රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව අප අධිකාරිය විසින් ක්‍රියාත්මක භෞතික හා සමාජ සංවර්ධන වැඩසටහන් පෙරටත් වඩා සඵලදායි නව මුහුණුවරකින් පෙලගැස්වීමට අප හට හැකියාව ලැබිණි. විශේෂයෙන්ම අපගේ අත්දැකීම් හා නිරීක්ෂණ මත පදනම්ව හඳුනාගන්නා ලද අඩුපාඩු සඳහා පිළියම් යොදමින් ඉහල කාර්යක්ෂමතාවයකින් යුතුව සැබෑ ලෙසට නාගරික ප්‍රජාවට ප්‍රතිලාභ ලබාදිම මත පදනම් වූ දීපව්‍යාප්ත වැඩසටහන් වලින් සමන්විත වූ ක්‍රියාකාරි සැලැස්මක් අප විසින් සකස් කරන ලදි.

විශේෂයෙන්ම සියලුම නාගරික බල ප්‍රදේශ ආවරණය වන පරිදි සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමටත් , දිනෙන් දින ඉහල යන නිවාස ඉල්ලුම සපුරාලීමට දිස්ත්‍රික්කයකට අවම වශයෙන් නිවාස ඒකක 100ක් ඉදිවන ලෙස මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමත් සිදුකරන ලදී.

2024 වසරේදී මෙම මධ්‍යම පාන්තික ජනතාව සඳහා හඳුනගෙන ඇති ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක කිරිම සඳහා මූලික නිෂ්කාෂණයන් හා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ව්‍යාපෘති 02ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරිමට අපට හැකි විය.

එමෙන්ම සමාජ සංවර්ධන වැඩසටහන් වපසරිය තවදුරටත් ව්‍යාප්ත කරමින් නාගරික සංවර්ධන අධිකාරිය වැනි සමාන්තර ආයතන විසින් ඉදිකරන ලද මහල් නිවාස ව්‍යාපෘති වල ප්‍රජාවද එම වැඩසටහන් වලට සම්බන්ධ කර ගැනිමට අපට හැකියාව ලැබිම තුලින් එම මහල් නිවාස වල දැනට පවත්නා ගැටලු වලට පිළියම් යෙදීමට සක්‍රිය දායකත්වයක් අප විසින් ලබාදෙන ලදි.

අධිකාරියෙහි සේවය කරනු ලබන නිලධාරීන් අතුරින් නිවාස ගැටළු සහිත නිලධාරීන් වෙත නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණු අතර, එමගින් නිලධාරීන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීමටත්, සේවක සංතෘප්තතාවය නැංවීමටත් 2024 වර්ෂය තුළදී හැකිවිය.

ඉදිරියේදී තවදුරටත් පුළුල් පරාසයක් ඔස්සේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි කාර්යභාරය ව්‍යාප්ත කරමින් ක්‍රියාත්මක කිරීම තුළින්, ශ්‍රී ලංකාවෙහි නාගරික අඩු පහසුකම් හා මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමට හැකි වේවායි හෘදයාංගමව ප්‍රාර්ථනා කරමි.

**කේ.කේ.ඩබ්.තුෂාරි ප්‍රියංකා ද සිල්වා**
**අධ්‍යක්ෂ ජනරාල්**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය සහ සංයුතිය

නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ප්‍රජාවගේ නිවාස ගැටළු සඳහා විසඳුම් ලබා දීම හා ඔවුන්ව සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වේ. ඒ සඳහා භෞතික හා සමාජ සංවර්ධනය යන දෙවැදෑරුම් ප්‍රවේශයන් යටතේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලබන සියලුම ගණුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර, ගිණුම් පොත් පවත්වාගෙන යාම, සහතික කිරිමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකිම අධිකාරිය වෙත පැවරි ඇත. ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල දී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතින් අනුගත කර ගැනීමටත්, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලා ඇත. අධිකාරිය සතු වත්කම් නිසිපරිදි කළමනාකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. ඊට අදාළ වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනියත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනිමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන අභ්‍යන්තර පරීක්ෂා කිරිම්, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

# 2024.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි නව අධ්‍යක්‍ෂ මණ්ඩලය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නිලබලයෙන් පත්වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**



**ඉංජි.එල්.බී.කුමුදුලාල් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නිල බලයෙන් පත්වන සාමාජික ඉංජි.එල්.බී.කුමුදුලාල් මහතා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර හොබවන අතර මොරටුව විශ්ව විද්‍යාලයේ පාරිසරික ඉංජිනේරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍ර උපාධියක් හා සිවිල් ඉංජිනේරු පිළිබඳ උපාධිය හදාරා ඇත.

එසේම ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරනු ලබන ලබන අතර, ජල සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ සහ අතිරේක ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ) ඇතුළු ප්‍රධාන තනතුරු ද හොබවා ඇත.



**එන්.බී.එම්.රණතුංග මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නිල බලයෙන් පත්වන සාමාජික එන්.බී.එම්.රණතුංග මහතා ක්‍රම සම්පාදන සේවයේ ද තනතුර හොබවා ඇති අතර, මේ වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර දරයි.

එසේම ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්වය ද දරනු ලබයි.



**එච්.එම්.ජේ.එම්.හේරත් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නිල බලයෙන් පත්වන සාමාජික එච්.එම්.ජේ.එම්.හේරත් මහතා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ අධිකරණ, පළාත් සභා හා පළාත් පාලන අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) තනතුරේ සේවය කරනු ලබයි.



**රේණුකා කොළඹගේ මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව නිල බලයෙන් පත්වන සාමාජික රේණුකා කොළඹගේ මහත්මිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිණී තනතුරේ සේවය කරනු ලබයි.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව පත්කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්



**වාස්තු විද්‍යාඥ සිතුමිණි රත්නමලල මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වරලත් වාස්තු විද්‍යාඥ වශයෙන් සේවය කරනු ලබයි.

මොරටුව විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධියක්, කැලණිය විශ්ව විද්‍යාලයේ වාග් විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලයේ උපදේශනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව, මොරටුව විශ්ව විද්‍යාලයේ නිර්මාණ පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද හදාරා ඇත.

එසේම ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනයේ වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු ද වේ. විෂයමාලා සංවර්ධන ජාතික අධ්‍යයන ආයතනයේ ද, කර්මාන්ත අමාත්‍යාංශයේ සාමාජික - සම් අංශය සඳහා උපදේශක ලෙස ආයතන කිහිපයක උපදේශක මණ්ඩල සාමාජිකත්ව දරනු ලබයි.



**නීතිඥ වී.ර්.වෙල්ලප්පුලි මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

නීතිඥවරයෙකු වශයෙන් සේවය කරනු ලබන අතර, කලා ගෞරව උපාධිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් තිබේ.

එමෙන්ම සහකාර අධ්‍යක්ෂ (නීති) ලෙස අල්ලස් සහ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ද සේවය කර ඇත.

රජයේ නීතිඥ ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ වසර 04ක පමණ කාලයක් සේවය කර ඇත. තවද 2012 සිට මේ දක්වා ස්වාධීන උපදේශකයෙකු වශයෙන් ද කටයුතු කරනු ලබයි.



**ඉංජි.ජානක පෙරේරා මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

මොරටුව විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරියෙක් වන අතර, තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ පශ්චාත් උපාධිය හදාරා ඇත.

එමෙන්ම, තෝරාගත් ආසියාතික රටවල් සමූහයක "ජාතික මට්ටමින් තාක්ෂණ හැකියාවන් සංවර්ධනය" පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ පර්යේෂණ ව්‍යාපෘතියක සේවය කර ඇත.

ඉදිකිරීම් කර්මාන්තය, ඇඟලුම්, ආහාර සැකසුම් සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය (තේ සහ රබර් සැකසීම) සම්බන්ධ ක්ෂේත්‍රයන්හි වසර 33 ක පමණ කාර්මික කළමනාකරණ පළපුරුද්දක් සතු වේ.

# 2024.01.01 දින සිට 2024.10.01 දින දක්වා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය



**හේරත් ආරච්චිලාගේ නිමේෂ් දිල්ෂාන් හේරත් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර හොබවන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ තොරතුරු තාක්ෂණය පිළිබඳව විද්‍යාවේදී ගෞරව උපාධිය ( SLIIT)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධිය ලබාඇත.

සංචාරක ක්ෂේත්‍රයෙහි අලෙවිකරණය, ව්‍යාපාර සංවර්ධනය, විකුණුම් සහ අලෙවි කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය සහ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳව වසර 08කට ආසන්න කාලයක පළපුරුද්ද සමඟ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වසර 15කට අධික කාලයක සේවා පළපුරුද්දක් ලබා ඇත.

තවද,

සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය

අධ්‍යක්ෂ, කලම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලප්මන්ට් සමාගම

අධ්‍යක්ෂ , ලංකා රෙස්ට් හවුස් සමාගම

සභාපති, නාගරික ආයෝජන සහ සංවර්ධන පුද්ගලික සමාගම

අධ්‍යක්ෂ, ඔනාලි හෝල්ඩින්ස් සමාගම

අධ්‍යක්ෂ , තේ, රබර් හා පොල් වතු , කැබලි කිරිමේ පාලන මණ්ඩලය
යන ආයතන වල නිලතල හොබවනු ලබයි.



**රජීව් සූරියාරච්චි මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති තනතුර හොබවන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික , නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, නාගරික සංවර්ධන අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික , හෝටල් සංවර්ධකයින්ගේ (ලංකා) සමාගම

අධ්‍යක්ෂ , තේ, රබර් හා පොල් වතු, කැබලි කිරිමේ පාලන මණ්ඩලය

උප සභාපති, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම (2019 සිට 2022)

උප සභාපති- Cooplife Insurance Company
අධ්‍යක්ෂ , මාර්ග සංවර්ධන අධිකාරිය

සම්බන්ධීකරණ ලේකම් නියෝජ්‍ය අමාත්‍ය (ආපදා කළමනාකරණ)

සම්බන්ධීකරණ ලේකම් නියෝජ්‍ය අමාත්‍ය (වාරිමාර්ග හා ජල කළමනාකරණ 2010 – 2015

සම්බන්ධීකරණ ලේකම්, අමාත්‍ය (අධිවේගී හා මාර්ග සංවර්ධන) 2006 - 2010



**බොතලේ අප්පුහාමිලාගේ රුක්මල් චාමින්ද පියරත්න මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක)**

මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ සේවය කරනු ලබයි මේ වන විට ,

කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශිය සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2015

කැළණි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ (මානව සම්පත් කළමනාකරණය) විශේෂ පිළිබඳ උපාධිය දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය

මිලෝඩා මුල්‍ය අධ්‍යයන ආයතනයේ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම් පිළිබඳ ඩිප්ලෝමාව 2018

-ICTAD ආයතනයේ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2009

DIPPCA-SLIDA ආයතනයේ රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව- 2008

රජයේ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ වසර 08ක වෘත්තිමය පළපුරුද්ද - (2005-2012)

ප්‍රාදේශීය සැලසුම් පිළිබඳ වසර 05 පළපුරුද්ද (2012-2017)

ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණ පිළිබඳ වසර 4ක පළපුරුද්ද (2017 - මේ දක්වා)ලබයි.



**ඒකනායක වලව්වේ නලින් සමරකෝන් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සේවය කරනු ලබන අතර මේ වන විට,

Senior Attorney -at-Law as an Apprentice as AJS Associate & Legal Consultants. - 2012

Junior partner at at-Law as an Apprentice as AJS Associate & Legal Consultant 2013-2015

Partner at AJS Associate & Legal Consultant - 2015-2019

Independent Counsel & Legal Consultant - 2013 to date.

Partner at Samarakoon & Ranasinghe Associates from 2019 to date.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් 2012 වර්ෂයේ දී දිවුරුම්දීම

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිඥ අවසන් වසර පරීක්ෂණය 2011 වර්ෂයේ දී සාර්ථකව අවසන් කිරිම

2011 වර්ෂයේ දී නීතිවේදී උපාධිය ලබාගැනිම (විවෘත විශ්වවිද්‍යාලය)

ඉංග්‍රීසි ඩිප්ලෝමාව (NIBM) 2013

කම්කරු කළමණාකරන පිළිබඳ පාශ්චාත් උපාධිය ලබාගැනිම (කැලණිය විශ්වවිද්‍යාලය)



**කුලප්පු තන්තිරි කෝරාළලාගේ ප්‍රසන්න අරම්පත් මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සේවය කරනු ලබන අතර ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිත්කත්ව දරනු ලබයි

නීතිවේදී උපාධිය (විවෘත විශ්වවිද්‍යාලය) 2011

ඉංග්‍රීසි ඩිප්ලෝමාව (NIBM) 2013

කම්කරු කළමනාකරණ පශ්චාත් උපාධිය (කැලණිය විශ්වවිද්‍යාලය)

නාගරික සංවර්ධන අධිකාරි - අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

රක්නා ලංකා ආරක්ෂ සමාගම - කවුන්සිලයේ සාමාජික

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**මානව හිමිකම් ක්‍රියාකාරිකයෙකු ලෙස 1992 සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කර ඇත.**

1992 සිට 2015 කාලය තුල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් විමර්ශනය.

• 1992 සිට 1996 දක්වා මානව හිමිකම් කාර්ය සාධක බලකායේ (HRTF) වසර 4 ක පළපුරුද්ද, (කනිෂ්ඨ විමර්ශන නිලධාරියෙකු ලෙස) නිලධාරියෙකු ලෙස සේවයට බැදී ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරියෙකු ලෙස උසස් වීම් ලබා ඇත.

**(පරිපාලනය සහ මුල්‍ය අධ්‍යක්ෂ)**

• 2013.06.12 දින සිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වැඩ බලන අධ්‍යක්ෂ පරිපාලක සහ මුල්‍ය නිලධාරියෙකු ලෙස උසස් වීම් ලබා ඇත.



**ජී.සී.ඒ.යු.ප්‍රනාන්දු මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

වාණිජ පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (1989 – 1992)

මාධ්‍ය නිදහස හා ප්‍රකාශනය පිළිබඳව ( **International Academy for Leadership, Germany** )

දේශපාන උපායමාර්ග සම්බන්ධයෙන් (**Council of Asia Liberals & Democrats, Indonesia)**

තරුණ සේවා නිලධාරි - යෞවන සංවර්ධන හා රැකියා අමාත්‍යාංශය 1990 – 1994

අභ්‍යාසලාභී ගුරු - අධ්‍යාපන අමාත්‍යාංශය 1994 – 2006

නිදහස් - මාධ්‍යවේදි - ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය 1994 – 2006

කළමනාකරු මානව සම්පත් සහ සමාජ අනුකූලතා - Global Transportation and Logistics Pvt Ltd Seeduwa 2006 -2012 )

ප්‍රධාන විධායක නිලධාරි - Lanka Television Network (Pvt) Ltd. (VFM Radio) 2012 – 2018)

අධ්‍යක්ෂ ප්‍රවර්ධන - SMR Engineering (Pvt) Ltd 2004 මේ දක්වා )

සම්බන්ධීකරණ ලේකම් - පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ 2020 සිට මේ දක්වා



**ඩී.එස්.ජේ. හේවාවිතාරණ මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ / සිවිල් ඉංජිනේරු
SMR Engineering (Pvt.) Limited 2004 මාර්තු - වර්තමාන කොළඹ.

අධ්‍යක්ෂ මෙහෙයුම්,ඉසුරු ඉංජිනේරු පුද්ගලික සමාගම, 1993-2003

ව්‍යාපෘති කළමනාකරු, උපදේශන ඉංජිනේරු සහ කොන්ත්‍රාත් පුද්ගලික සමාගම ,1991-1992

වැඩබිම් ඉංජිනේරු, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, 1986-1991

වැඩ ඉංජිනේරු, නිවාස සංවර්ධන අධිකාරිය, 1985-1986

ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලයේ සභාපති

ජාතික ඔලිම්පික කමිටුවේ විධායක කමිටු සාමාජික

එස්එම්ආර් ඉංජිනේරු පුද්ගලික සමාගමේ සභාපති

අධ්‍යක්ෂ (මෙහෙයුම්) ඉසුර ඉංජිනේරු පුද්ගලික සමාගම , කොළඹ 07 ,1993 – 2003

මෙහෙයුම් කළමනාකරු , K.M.C. 1984 - 1985



**ප්‍රදීප් වීරසේකර මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

සබරගමුව විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යයනය) උපාධිය.- 1997

කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති (සේවා කළමනාකරණය)පශ්චාත් උපාධිය - 2016

පෞද්ගලික ලේකම්, ගරු නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ -2020

පෞද්ගලික ලේකම්, ගරු අපනයන සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන ,සංචාරක සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ - 2020.

ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2020.

පෞද්ගලික ලේකම්,බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ.

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023

සම්බන්ධීකරණ ලේකම් , ගරු වරාය සංවර්ධන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය , රෙජී රණතුංග මැතිතුමාගේ - 2001

කොළඹ මහ නගර සභාවේ සුභසාධක නිලධාරී 2009 - 2024



**කහටපිට කංකානමලාගේ සුජීව සම්පත්**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විධායක නොවන)**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) ජීව විද්‍යා අංශය

කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමාව

ජාතික තරුණ සේවා සභාවේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ සමස්ථ ලංකා ප්‍රධාන ලේකම්වරයා ලෙස කටයුතු කිරීම

ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම

මීනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව රාජ්‍ය නිලධාරියෙකු ලෙස වසර 10ක සේවය

මීනුවන්ගොඩ ප්‍රාදේශිය සභාවේ උප සභාපතිවරයා ලෙස 2011 වසරේ සිට දෙවතාවක් කටයුතු කිරීම

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් හා සම්බන්ධීකරණ ලේකම් ලෙස වසර 10ක සේවා කාලය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම

සංචාරක අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම

කාර්මික අපනයන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම.

දකුණු ආසියානු කලාපීය තරුණ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

# අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම | රැස්වීම් අංකය හා පවත්වන ලද දිනය | පැමිණීම |
|---|---|---|
| | 2024.12.18 | |
| | 11/2024 | |
| ජේ.එස්.ඩී.එම්.අසංක අබේවර්ධන මහතා | √ | 1/1 |
| ඉංජී.එල්.බී.කුමුදුලාල් මහතා | √ | 1/1 |
| එන්.බී.එම්.රණතුංග මහතා | √ | 1/1 |
| එච්.එම්.ජේ.එම්.හේරත් මහතා | √ | 1/1 |
| රේණුකා කොළඹගේ මහත්මිය | √ | 1/1 |
| වාස්තු විද්‍යාඥ සිතුමිණි රත්නමලල මහතා | √ | 1/1 |
| නීතිඥ වී.ර්.වෙල්ලප්පුලි මහතා | √ | 1/1 |
| ඉංජී.ජානක පෙරේරා මහතා | √ | 1/1 |

# අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය 2024.01.01 – 2024.10.01

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම | රැස්වීම් අංකය හා පවත්වන ලද දිනය | | | | | | | | | | | පැමිණීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2024.01.02 11/ 2023 | 2024.01.30 01/ 2024 | 2024.02.28 02/ 2024 | 2024.03.26 03/ 2024 | 2024.04.10 04/ 2024 | 2024.05.28 05/ 2024 | 2024.07.03 06/ 2024 | 2024.07.25 07/ 2024 | 2024.08.21 08/ 2024 | 2024.08.30 09/ 2024 | 2024.09.12 10/ 2024 | |
| ආර්.එම්.එස්.පී.කේ. රත්නායක මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11/11 |
| එච්.ඒ.එන්. හේරත් මහතා | √ | √ | √ | √ | - | √ | - | - | √ | - | - | 11/06 |
| රජිව් සූරියආරච්චි මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11/11 |
| බී.ඒ.ආර්.සී.පියරත්න මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11/11 |
| ඊ.ඩබ්.නලීන් සමරකෝන් මහතා | √ | √ | √ | √ | √ | √ | - | √ | √ | √ | √ | 11/10 |
| කේ.ටී.කේ.පී.අරම්පත් මහතා | √ | √ | √ | √ | √ | √ | - | √ | √ | √ | √ | 11/10 |
| ජී.සී.ඒ.යු.ප්‍රනාන්දු මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 11/11 |
| ඩී.එස්.ජේ.හේවාවිතාරණ මහතා | √ | √ | √ | √ | √ | √ | √ | - | - | √ | √ | 11/09 |
| ප්‍රදීප් විජේරත්නසේකර මහතා | √ | √ | √ | √ | √ | √ | √ | √ | - | - | - | 11/08 |
| කේ.කේ.සුජීව සම්පත් මහතා | √ | √ | √ | √ | √ | √ | - | √ | √ | √ | - | 11/09 |

# උපදේශක කමිටු සමාලෝචනය සහ සංයුතිය

2008 අංක 36 දරන පනතින් සංස්ථාපිත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව උපදේශක කමිටුව පිහිටුවනු ලැබූ අතර, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව මෙම කමිටුව ප්‍රමාණවත් ස්ත්‍රී, පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික වෙමින් උපදේශක කමිටුව සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයින් 14 දෙනෙකුට වැඩි නොවන පිරිසකගෙන් සමන්විත විය යුතු බව සඳහන් කර ඇත.

අධිකාරිය පනත අනුව පත් කර ගන්නා ලද උපදේශක කමිටුව මඟින් පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුවේ. එනම්,

අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩසටහන්වලට අදාළ යම් කාරණාවක් අනුමත කිරීමේදී සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමේදී උපදෙස් ලබාදීම.

උපදේශක කමිටුවේ කාර්යභාරය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රීති හා කර්තව්‍යයන් ඉටුකිරිම.

**අධිකාරියේ උපදේශක කමිටු සංයුතිය**

| | |
|---|---|
| නීතිඥ කේ.ටී.කේ.ප්‍රසන්න අරම්පත් මයා | - කමිටු සභාපති |
| වරලත් ඉංජිනේරු ඩී.ටී.රාජසේකරන් මයා | - කමිටු සාමාජික |
| වරලත් වාස්තුවිද්‍යා බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය | - කමිටු සාමාජික |
| කේ.ඩී.නිහාල් හේවගේ මයා | - කමිටු සාමාජික |
| තරංග නලීන් ගම්ලත් මයා | - කමිටු සාමාජික |
| ශානිකා ගොපල්ලව මෙය | - කමිටු සාමාජික |
| සුජානි බෝගොල්ලාගම මිය | - කමිටු සාමාජික |



**කමිටු සභාපති**
**නීතිඥ**
**කේ.ටී.කේ.ප්‍රසන්න අරම්පත්**



**කමිටු සාමාජික**
**වරලත් ඉංජිනේරු**
**ඩී.ටී.රාජසේකරන් මයා**



**කමිටු සාමාජික**
**වරලත් වාස්තුවිද්‍යා**
**බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය**



**කමිටු සාමාජික**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**කේ.ඩී.නිහාල් හේවගේ මයා**



**කමිටු සාමාජික**
**ශානිකා ගොපල්ලව මෙය**



**කමිටු සාමාජික**
**සුජානි බෝගොල්ලාගම මිය**

# විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, නියෝජ්‍ය අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ, බී.ඒ.ආර්.සී. පියරත්න මහතා කමිටු සභාපති ලෙස කටයුතු කළ අතර අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වන නීතිඥ නලින් සමරකෝන් මහතා සහ ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

ජාතික විගණන කාර්යාලයේ, විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හීදි අනෙකුත් නිලධාරීන් රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2024 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති සඳහා නිර්දේශ කරන ලදි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 02 ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදි.

සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

සාමාජිකයින්, නිරීක්ෂකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,



**කමිටු සභාපති**
**බී.ඒ.ආර්.සී. පියරත්න මහතා**



**කමිටු සාමාජික**
**නීතිඥ නලින් සමරකෝන්**



**කමිටු සාමාජික**
**ජී.සී.ඒ.යූ. ප්‍රනාන්දු මහතා**

**අධ්‍යක්ෂ ජනරාල්, විගණන හා කළමනාකරණ කමිටු ලේකම්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය



# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ
# ප්‍රධාන නිලධාරි මණ්ඩලය



ජේ.එස්.ඩී.එම්.අසංක අබේවර්ධන මහතා
සභාපති
2024.10.16 දින සිට



කේ.කේ.ඩබ්.තුෂාරි පී.ද සිල්වා මිය
අධ්‍යක්ෂ ජනරාල් 2024.11.19 දින සිට
අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප) 2024.11.18 දක්වා



ප්‍රියන්ත කේ.රත්නායක මහතා
සභාපති
2022.08.04 සිට 2024.10.10



විජයානන්ද හේරත් මහතා
අධ්‍යක්ෂ ජනරාල්
2022.08.04 සිට 2024.11.18



පී. එම්.ඒ. වීරක්කොඩි මිය
අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ)
2024.03.01 දක්වා



එස්.සුරංග මුණසිංහ මහතා
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප)
රාජකාරි ආවරණ
2024.11.26 සිට



ආර්.ඩී. සුසන්ත ප්‍රනාන්දු මහතා
වැ.බ. අධ්‍යක්ෂ (මුදල්)
2024.09.09 සිට



ආර්.ඒ.සුසන්ත මහතා
වැ.බ. අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)
2024.03.02 සිට



ඒ.එම්.කේ.බී. අතාවුද මහතා
වැ.බ.අධ්‍යක්ෂ (මුදල්)
2023.11.30 සිට 2024.09.06 දින දක්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අයකිරීම්)



ඒ.පී.ආර්. ඥානප්‍රිය මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
වැ.බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
2024.09.09 සිට



එල්.ආර්.ඒ. ශාන්ත මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(අභ්‍යන්තර විගණක)



අනුෂා රාජපක්ෂ මෙනවිය
සහකාර අධ්‍යක්ෂ
(වාස්තු විද්‍යා)



කේ.අයි. දර්ශනී මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



එම්. පුෂ්පා මිය
සහකාර අධ්‍යක්ෂ
(සමාජ සජීවිකරණ)



ඒ.එල්. හර්ෂ දිලංකර මහතා
සහකාර අධ්‍යක්ෂ
(ඉඩම් හා වත්කම් කළමනාකරණ)



ජයාත්‍රි ආරියතිලක මිය
සහකාර අධ්‍යක්ෂ
(පර්යේෂණ හා සංවර්ධන)
2024.10.03 දක්වා



ශලනී අගලවත්ත මිය
සහකාර අධ්‍යක්ෂ (නීති)



ඒ.ඒ.වටගෙදර මෙනවිය
සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
රාජකාරි ආවරණ 2024.11.26 සිට

# භෞතික සංවර්ධන වැඩසටහන





# භෞතික සංවර්ධන වැඩසටහන

2008 අංක 36 දරන පනතින් ස්ථාපිත කරන ලද නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව, නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාව වෙත භෞතික සංවර්ධන හා සමාජ සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධිකාරියෙහි මුඛ්‍ය අරමුණ වන අතර, එහි එක් ප්‍රවේශයක් ලෙස භෞතික සංවර්ධන වැඩසටහන හඳුන්වා දිය හැක.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මේ දක්වා ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතිවල සංවර්ධන කටයුතු සිදුකිරීම මෙන්ම තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති කිරීම උදෙසා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ප්‍රවේශය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතින්හි මූලික අනුමැතින් හා නිශ්කාෂන කටයුතු හා ඉඩම් පවරා ගැනීම් හා අත්පත් කර ගැනීමේ කටයුතු 2024 වර්ෂයේ දී සිදුකිරීමට සැලසුම් කරන ලදී.

ඒ අනුව, එම නිවාස ව්‍යාපෘතින් සම්බන්ධව හා එම ව්‍යාපෘති සඳහා අත්කරගත් භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි පෙළගැස්විය හැකිය.

එමෙන්ම 2021 වර්ෂයේ ජනතා අයිතියට පත් කරන ලද මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතියක් වන ලුනාව "සීවිව්" නිවාස ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන් වෙත හිමිකම් ඔප්පු ලබාදීම ද මෙම වර්ෂයේ දී සිදුකරන ලදී.

# 2024 වර්ෂයේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති

### වැලිසර මිල්ලගහවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ඉදිකිරීමට සැලසුම් කර ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 179 ඇලපිටවල ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 2.4532 ප්‍රමාණයකින් යුත් මෙම ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාරව නිදහස් දීමනාවක් ලෙස නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

අමප අංක 24/0165/618/010 දරණ 2024.01.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලද අනුමැතිය ප්‍රකාරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව ජාතික හෝ අන්තර්ජාතික තරඟකාරී ලංසු ක්‍රමවේදයට අනුව ප්‍රසම්පාදනය කටයුතු සිදුකරමින් පවතී.

එසේම, ව්‍යාපෘති යෝජනා කැඳවීම වෙනුවෙන් පාංශු ස්ථර පිළිබඳ අදහස් ගැනීමේ අරමුණ පෙරදැරිව ව්‍යාපෘතිය සඳහා මූලික පාංශු පරීක්ෂණ වාර්තාව ද ලබාගෙන ඇති අතර, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික නිශ්කාෂණ සහතික ලබා ගැනීම වෙනුවෙන් වන අයදුම්පත් නාගරික සංවර්ධන අධිකාරිය වෙත සහ ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලය (කැළණිය) වෙත යොමු කර ඇත.

### නිට්ටඹුව ඕර්චර්ඩ්වත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ඉදිකිරීමට සැලසුම් කර ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නබදලුව ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 3.6932ක ප්‍රමාණයකින් යුත් ඉඩම අංක 2296/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය 2024.06.14 වන දින හිමි වී ඇත.

ඒ අනුව, අමප අංක 21/0911/340/018 දරණ 2021.05.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීම් සිදුකරන ලද අතර, ඒ සඳහා වන තාක්ෂණික යෝජනා ඇගයීම් සිදු කෙරෙමින් පවතී.

තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික නිශ්කාෂණ සහතික ලබා ගැනීම වෙනුවෙන් වන අයදුම්පත් නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික විදුලිබල මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත යොමු කර ඇත.

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ඉදිකිරීමට සැලසුම් කර ඇති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 521 A, ඇතුල්කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර 0.2795ක භූමි ප්‍රමාණයකින් යුත් මෙම ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාරව නිදහස් දීමනාවක් ලෙස නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ඇත.

තවද , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම සඳහා වන තක්සේරු වාර්තාව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන ඇත.

### හික්කඩුව, තුඩුවේගොඩ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය

නාගරික කලාපයන්හි ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නංවාලනු වස් භෞතික සංවර්ධන ව්‍යාපෘති සිදුකිරිම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කොට, තුඩුවේගොඩ නාගරික නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. එහෙත්, BD/CBP/01/04-2022 දරණ රාජ්‍ය වියදම් පාලනය පිළිබඳ ජාතික අයවැය චක්‍රල්බය ප්‍රකාරව භෞතික සංවර්ධන ව්‍යාපෘතීන්හි ඉදිකිරිම් කටයුතු අත්හිටුවීමට සිදුවිය. එකී හේතුව මත මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ සිදුකිරීම සඳහා නව ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදි.

එම ව්‍යාපෘති යෝජනාව අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

මෙම ව්‍යාපෘතියට අදාල හෙක්ටයාර් 0.6655 ක ප්‍රමාණයෙන් යුත් ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාරව නිදහස් දීමනා ලෙස නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නමින් පවරා ගැනීමේ කටයුතු අවසන් අදියරයෙහි පවතින අතර, 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව මෙම ඉඩමට යාබද පිහිටි පෞද්ගලික ඉඩම් කොටසක් ද මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගැනීමට කටයුතු සිදුකරමින් පවති.

### අතුරුගිරිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 487 ඒ ශාන්තාලෝකගම ග්‍රාම නිලධාරි වසමට අයත් හෙක්ටයාර් 0.4046ක භූමි ප්‍රමාණයක මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, මෙම ඉඩම 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

### කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

කඩුවෙල තැපැල් කාර්යාලය පිහිටි හෙක්ටයාර 0.2757ක ප්‍රමාණයෙන් යුතු ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් 2024 වසරෙහි මධ්‍ය අදායම්ලාභී නාගරික ප්‍රජාව වෙනුවෙන් පෞද්ගලික සහභාගීත්ව ක්‍රමවේදය යටතේ සිදුකිරීම සඳහා සැලසුම් කර තිබූ උක්ත නිවාස ව්‍යාපෘතීන්ට අදාලව මූලික අනුමැතීන් ලබාගැනීමේ කටයුතු, ඉඩම් පවරාගැනීමේ කටයුතු සහ ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරන ලදි.

මෙම වසර තුල පැවති ආර්ථික අර්බුදය හමුවේ රට තුල සියලුම ඉදිකිරීම් කටයුතු අඩපන වූ අතර ව්‍යාපෘති සඳහාද ව්‍යාපෘති සංවර්ධකයකු හෝ ආයෝජකයෙකු සොයාගැනීම අසීරු විය.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම් නිවාස ව්‍යාපෘතීන් හි නිවාස බැහැර කිරීම, සංවර්ධන කටයුතු හා පවරා ගැනීම

### අඟුලාන, සයුරුපුර නිවාස ව්‍යාපෘතිය

මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඟුලාන උතුර ග්‍රාම නිලධාරි වසමෙහි හෙක්ටයර් 0.6695 ක විශාලත්වයෙන් යුතු පයුරුගහවත්ත, දොඹගහවත්ත/ වැටකෙයියාගහවත්ත නැමැති ඉඩම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය හිමි වී ඇත. ඒ සඳහා වන දීමනා පත්‍රය සකස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර, මෙම ඉඩමේ අයිතිය අධිකාරිය සතුවීමත් සමග මෙම නිවාස ව්‍යපෘතිය බැහැර කර ඇති ප්‍රතිලාභීන් වෙත ඔප්පු ප්‍රදානය කිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි වනු ඇත.

තවද, මෙම නිවාස ව්‍යාපෘතියේ බාහිර පාර්ශවයන් විසින් හානියට පත්කර ඇති නිවාස ඒකක 11ක් ස්ථිර පදිංචියක් නොමැති නව ප්‍රතිලාභීන් හට බැහැර කර ඇති අතර, ඒ අතුරින් නිවාස ඒකක 08ක අලුත්වැඩියා කටයුතු මෙම වසරේදි සිදුකර ඇත.

### අනුරාධපුර, තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුලාන 302 කටුකැලියාව ග්‍රාම නිලධාරි වසමේ හෙක්ටයාර් 7.7586 ක විශාලත්වයෙන් යුතු පරසන්ගස්වැව මූකලාන නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභින් වෙත බැහැර කර ඇති අතර, මෙම ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 6 (1) වගන්ති ප්‍රකාර නිදහස් දීමනාවක් ලෙස අධිකාරිය වෙත පවරා ගෙන ඇත.

තවද, මෙම නිවාස ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන් වෙත බැහැර කර නොතිබූ නිවාස මෙම වසරේ දී සුදුසු ප්‍රතිලාභීන් වෙත බැහැර කිරීම සිදුකර ඇත.

### තලවකැලේ, ළිඳුල නිවාස ව්‍යාපෘතිය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, හොලිරූඩ් ස්ටේට් නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර, ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇති අතර, මෙම ඉඩමට අදාළ තක්සේරු වාර්තාව ලබාගන්නා ලදී. ඒ අනුව, මෙම ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කර ඇත.

### හලාවත, නරියාගොඩැල්ල නිවාස ව්‍යාපෘතිය

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, 568 මුන්නේශ්වරම ග්‍රාම නිලධාරි වසමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.308ක ප්‍රමාණයකින් යුත් මීකුලම හෝ නරියගොඩැල්ල නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇති අතර, මෙම ඉඩම අධිකාරිය වෙත විකුණුම් ඔප්පුවක් මගින් පවරා ගෙන ඇත. මෙම වසරේදී නිවාස ව්‍යාපෘතියේ නිවසක් පිළිසකර කිරීම් වලට අදාළව සිදුකළ යුතු වැඩ කොටස් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

තවද මෙම ව්‍යාපෘතියේ කාණු පද්ධතිය ඉදිකිරිම හා යටිතල පහසුකම් සැලසිම සඳහා අධිකාරියේ අභ්‍යන්තර ප්‍රතිපාදන තුළින් රු. මිලියන 2.86ක මුදල හලාවත ප්‍රාදේශිය සභාව වෙත ලබා දීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත.

### සිංහපුර මහල් නිවාස ව්‍යාපෘතිය

තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ හෙක්ටයාර් 0.4423ක ප්‍රමාණයකින් යුත් 48 වත්ත නැමති ඉඩමෙහි මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රතිලාභීන් වෙත බැහැර කර ඇති අතර, මෙම ඉඩම රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්ති ප්‍රකාර නිදහස් දීමනා ලෙස අධිකාරිය වෙත පවරා ගෙන ඇත.

### වදුලු සෙවණ නිවාස ව්‍යාපෘතිය

වදුලු සෙවණ නිවාස ව්‍යාපෘතිය පිහිටි ඉඩමේ අයිතිය හිමි නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිදහස් දීමනා ලෙස රජය මගින් පැවරීම් සිදුකර ඇති නාගරික සංවර්ධන අධිකාරියෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

### සහස්පුර මහල් නිවාස ව්‍යාපෘතිය

බොරැල්ල "සහස්පුර" නිවාස ව්‍යාපෘතිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පූර්වගාමී ආයතනය වන රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් "තිරසර පුරවර" වැඩසටහන යටතේ කොළඹ මහ නගර සභා කලාපය තුළ අඩු පහසුකම් මධ්‍යයේ ජීවත් වූ පවුල් ඉලක්ක කරගනිමින් ඉදිකරනු ලැබූ මහල් නිවාස යෝජනා ක්‍රමයකි.

මෙම මහල් නිවාස සංකීර්ණයට අයත් සභාධිපත්‍ය ඒකක 329 ක් ප්‍රසිද්ධ නොතාරිස් ටී. ලියනආරච්චි මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 155 සහ 2018.02.21 දරන ඔප්පුව මගින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරන ලදී.

මෙම නිවාස ව්‍යාපෘතියේ වාණිජ ඒකකයන් අධිකාරියට ආදායමක් ලැබෙන පරිදි රජයේ තක්සේරුව මත පදනම්ව බැහැර කිරීම සඳහාද කටයුතු සම්පාදනය කරමින් පවතී.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘතියෙහි අලෙවිකිරීම සහ සංවර්ධන කටයුතු

### ලුනාව "සී වීව් රෙසිඩන්සීස්" නිවාස ව්‍යාපෘතිය

මධ්‍ය ආදායම්ලාභී හා පහළ මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් දැරිය හැකි මිලකට නිවාස ලබාදීමේ ක්‍රමවේදය යටතේ ආරම්භ කරන ලද නිවාස ඒකක 356කින් සමන්විත මෙම නිවාස ව්‍යාපෘතියේ සියලුම නිවාස ඒකක ප්‍රතිලාභීන් වෙත භුක්තිය බැහැර කර ඇත.

මෙම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදුකළ අතර, ව්‍යාපෘති කළමණාකරණය රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් සිදු කර ඇත.

මෙම වසරේදී ව්‍යාපෘතිය  සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපලක් ලෙස ප්‍රකාශ කිරීමේ අවසන් සහතිකය 2024.03.19 දින ලබා දෙන ලදී.

මෙම නිවාස ව්‍යාපෘතියේ බාහිර බිත්ති වල ජල මුද්‍රිතයන් ආලේප කිරීමට අදාළව ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම මෙම වසරේදී සිදු කරන ලදී.

## ඉදිරි භෞතික ව්‍යාපෘතින් හි පරිසරය ආරක්ෂා කර ගැනිමට හා පරිසරය වෙනුවෙන් සෘණාත්මක බලපෑමක් ඇති කරන ක්‍රියාකාරකම් අවම කිරිමට ගෙන ඇති පියවර

- විදුලිජනනයට හා ගෘහස්ථ ඒකක සඳහා උණු ජලය ලබාදීමට සූර්යය බලශක්තිය භාවිතා කිරිම
- ව්‍යාපෘතින් හා පොදු ප්‍රදේශ හරිත කලාප ලෙස සංවර්ධනය කිරිම හා ඒවායේ ඉදිරි නඩත්තුව කළමනාකරණ සංස්ථාව හරහා ප්‍රතිලාභින්ගේ සහභාගීත්වය ඇතිව සිදුකිරිම.
- ව්‍යාපෘති භූමිය තුල රැස්වන වැසි ජලය හා ගෘහස්ථ ඒකක මඟින් මුදාහරිනු ලබන අප ජලය ගබඩා කර පිරිපහදු කිරිමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ගෙවතු වගා කටයුතු සඳහා භාවිතා කිරිම.

# නිම කරන ලද නිවාස ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට නිවාස හිමිකම් හා ඔප්පු ලබාදීම

2024 වර්ෂයේ දී අධිකාරිය විසින් ජනතා අයිතියට පත් කරන ලද නිවාස ව්‍යාපෘතින්හි හිමිකම් ඔප්පු ලබාදීම සිදුකරන ලදී.

මෙහිදි ප්‍රතිලාභීන් වෙත දීර්ඝ කාලීන වාරික සින්න ගිවිසුම් මත නිවාස බැහැර කර තිබීම හේතුවෙන් බොහොමයක් නිවාස ව්‍යාපෘතිවල ඔප්පු ලබාදීමට නොහැකිව ඇති අතර, අදාළ ප්‍රතිලාභීන් එම ගිවිසුම් කාලසීමාව අවසනායේ සියලු ගෙවීම් නිම කිරීමෙන් අනතුරුව හිමිකම් ඔප්පු ලබාදීමේ හැකියාව පවතී.

### නිවාස වලට අදාල ඔප්පු ලබාදීමේ කටයුතු

| # | නිවාස ව්‍යාපෘතිය | නිවාස සංඛ්‍යාව | 2023 වර්ෂය දක්වා ඔප්පු ලබාදීමේ ප්‍රගතිය | 2024 වර්ෂයේ දී ලබාදී ඇති ඔප්පු | ලබාදීමට ඇති ඔප්පු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | සහස්පුර මහල් නිවාස ව්‍යාපෘතිය | 686 | 587 | - | 99 |
| 2 | අනුරාධපුර -තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතිය | 108 | 01 | - | 107 |
| 3 | වදුලුසෙවණ මහල් නිවාස ව්‍යාපෘතිය | 50 | - | - | 50 |
| 4 | සිංහපුර නිවාස ව්‍යාපෘතිය -I වන අදියර | 60 | - | - | 60 |
| 5 | සිංහපුර නිවාස ව්‍යාපෘතිය -II වන අදියර | 60 | - | - | 60 |
| 6 | අඹලාන ‘‘සයුරපුර’’ මහල් නිවාස ව්‍යාපෘතිය | 288 | - | - | 288 |
| 7 | හලාවත නරියගොඩැල්ල නාගරික නිවාස ව්‍යාපෘතිය | 57 | - | - | 57 |
| 8 | තලවාකැලේ නාගරික නිවාස ව්‍යාපෘතිය | 54 | - | - | 54 |
| 9 | ලුනාව සී විව් රෙසිඩන්සීස් මහල් නිවාස ව්‍යාපෘතිය | 356 | | 16 | 340 |
| | එකතුව | **1,719** | **588** | **16** | **1,115** |

# අවදානම් තක්සේරු කිරිමේ හා අවම කිරිමේ උපාය මාර්ග

| # | අවදානම් | අවදානම් අවම කිරීමේ උපාය මාර්ග. |
|---|---|---|
| 1 | අප අධිකාරිය හා අනෙකුත් සමාන්තර ආයතන පුනස්ථාපන නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිලාභීන් සඳහා පූර්ව සමාජ සජීවීකරණ වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම. | දැනට අධිකාරියේ පවත්නා මානව සම්පත් සීමාසහිත බව අවම කර ගැනීම සඳහා සියලු ම නාගරික බල ප්‍රදේශවලට දැනට සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්, ප්‍රජා සංවර්ධන සහකාර නිලධාරීන් හා සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් යොමු කිරීම, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක සිසුන් පුහුණු පදනම මත අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සමග ක්ෂේත්‍ර රාජකාරී සඳහා යෙදවීම. |
| 2 | ඉදිරි වසර 04ක කාලය තුල රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ ස්වයං වියදම් පියවාගැනිමේ ක්‍රමවේදයකට එළැඹිම. | අධිකාරිය විසින් “ව්‍යාපාර සැලැස්මක්” පිළියෙල කර ඇති අතර, ඒ අනුව, මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත ඌණ උපයෝජිත ඉඩම් උපයෝජනය කර ගනිමින් මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා එමගින් උපයන ආදායමින් සමාජ සංවර්ධන වැඩසටහන්, නිවාස ණය වැඩසටහන් හා පුනස්ථාපන නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| 3 | භෞතික හා සමාජ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් ජාලය පුළුල් කළ යුතු වීම. | දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරීන් ඇතුලු රාජ්‍ය නිලධාරීන්ගේ සහාය මෙම වැඩසටහන් සඳහා ලබාගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 4 | භෞතික සංවර්ධන වැඩසටහන් සඳහා ඉහළ ගොස් ඇති මූල්‍යමය වියදම (Finance Cost) හමුවේ සංවර්ධනකරුවන්ගේ සහභාගීත්වය අවම වීම. | ඉදිකිරීම්වලට අදාළ කාරක ප්‍රාග්ධනය පමණක් සංවර්ධනකරුවන්ට දැරීමට සිදුවන ආකාරයෙන් ඉදිකිරීම් ඉලක්ක මත පදනම්ව අතුරු ගෙවීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ මෙම ව්‍යාපෘතින් සියල්ල පෙර විකුණුම් පදනම මත මූල්‍යනය කිරීම. |
| 5 | නාගරික ඉලක්කගත ප්‍රතිලාභීන් හට දැරිය හැකි මිලකට නිවාස ලබාදිම සඳහා පවතින අභියෝග (නිවාස ඉදිරිකිරිම් සඳහා වන පිරිවැය හා ප්‍රතිලාභින්ගේ මිලදි ගැනිමේ හැකියාවේ ඇති අසමතුලිතතාවය) | වෙළඳපොළ සමීක්ෂණ වැනි නිසි අධ්‍යයනයන් සිදු කිරීම මඟින් අදාල ව්‍යාපෘතියේ ඉලක්ක ගත කණ්ඩායම් හඳුනා ගැනීම සහ ඒ අනුව දැරිය හැකි මිලකට නිවාස ලබාදිම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සිදු කරනු ලැබේ. |
| | | අභ්‍යන්තර ඉපැයීම් මගින් සහනදායී නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | | වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීමෙන් සහනදායී නිවාස ණය ලබා දීමට ඇති හැකියාව සොයා බැලීමට සාකච්ඡා ආරම්භ කර ඇත. |
| 6 | නාගරික බල ප්‍රදේශ වල පවතින ඉඩම් සීමිත වීම හා හඳුනාගෙන ඇති ඉඩම් සංවර්ධනය කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටළු. | ඌන උපයෝජිත රජය සතු ඉඩම් පවරාගෙන සිරස් සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම. |
| | | රාජ්‍ය ආයතන දැනට භුක්ති විදින එහෙත් තවදුරටත් සංවර්ධනය කිරීමේ හැකියාවක් ඇති ඉඩම් හඳුනාගෙන එම ආයතන සමග අන්තර්සහයෝගයෙන් දෙපාර්ශවයටම ප්‍රතිලාභ ලැබෙන ලෙස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. (උදා:- ශ්‍රී ජයවර්ධනපුර, කඩුවෙල හා අනුරාධපුර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතින් දැනට තැපැල් දෙපාර්තමේන්තුව භුක්ති විදින ඉඩම්වල සිදුකිරීම.) |
| | | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති ඉඩම් මිලදී ගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| 7 | අධිකාරියේ බලතල හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය වන ස්ථිර කාර්යය මණ්ඩලය මේ වන විට පුරප්පාඩුව පවතින බැවින් එහි කාර්ය සාධනය වෙත ඍජුව බලපෑම. | උපාධි අපේක්ෂක සිසුන් වැනි පුහුණු සිසුන් අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සමග ක්ෂේත්‍ර රාජකාරී සඳහා යෙදවීම. |
| | | බඳවාගැනීම් සිදුකිරීම් සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට ඉල්ලුම් කිරීම. |

# සමාජ සංවර්ධන වැඩසටහන



# සමාජ සංවර්ධන වැඩසටහන 2024

2008 අංක 36 දරන පනතින් ස්ථාපිත කරන ලද නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව, නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාව වෙත භෞතික සංවර්ධන හා සමාජ සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක වේ.

එහි එක් ප්‍රවේශයක් ලෙස නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස කේන්ද්‍ර කර ගනිමින් එහි වෙසෙන අඩු පහසුකම් නාගරික ප්‍රජාවගේ සමාජීය, ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර, ස්වශක්තියෙන් යුතුව ඔසවා තැබිම වෙනුවෙන් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, 2011 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත නාගරික කලාප තුළ වෙසෙන ප්‍රජාව මූලික කර ගනිමින් අඩු පහසුකම් සහිත ජනාවාස ප්‍රජාව කේන්ද්‍ර කරගෙන සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය.

ඒ අනුව, 2021-2025 පස් අවුරුදු ක්‍රියාකාරි සැලැස්ම තුළ මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර, 2021 වර්ෂයේ සිට ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වය ධනාත්මකව වර්ධනය කර ගැනීම සහ ප්‍රජා ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම ප්‍රධාන උප වැඩසටහන් 04 ක් යටතේ ක්‍රියාවට නංවනු ලබයි.

1) ප්‍රජා සංවර්ධන වැඩසටහන
2) අධ්‍යාපනික වැඩසටහන
3) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
4) ආගමික, සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

ඒ අනුව ඉහත සෑම මැදිහත්වීමකටම අදාළ උප මැදිහත්වීම් හා ක්‍රියාකාරකම් තුළින් ඌණ පහසුකම් සහිත ප්‍රජාවගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදීම සිදුකරනු ලබයි.

2024 වර්ෂයේදී, දිවයින පුරා දිස්ත්‍රික්ක 11ක් ආවරණය වන පරිදි ජනාවාස 28 ක නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත් වන නිවාස ඒකක 8796 ක සමාජ, ආර්ථික, සංස්කෘතික, සෞඛ්‍ය හා අධ්‍යාපනික තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම දිස්ත්‍රික්කවලට කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, රත්නපුර, නුවරඑළිය, මාතලේ, අනුරාධපුර, මොණරාගල ඇතුළත් වේ. බිම් මට්ටමේ ප්‍රජා සහභාගීත්ව මැදිහත්වීම් හරහා ප්‍රජා පාදක විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

# සමාජ සංවර්ධන වැඩසටහන ජනාවාසයන් තුළ ක්‍රියාත්මක කිරිම

## 1) ප්‍රජා සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන මඟින් ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා සමාජ ආර්ථික, සංස්කෘතික වශයෙන් යම් ඒකීයත්වයට පැමිණෙන තෙක් ඔවුන්ව අඛණ්ඩව සවිබලගැන්වීමේ වැඩ පිළිවෙලක් සකස් කිරිම මෙමඟින් අපේක්ෂා කෙරේ.

නාගරිකරණයත් සමඟ සමාජයේ අඩු ආදායම්ලාභී පවුල් මුහුණපා ඇති ගැටලු සඳහා සමාජ සජීවිකරණ වැඩසටහන් ඔස්සේ එම ගැටලු නිරාකරණය කර ගැනිමට, විශ්ලේෂණාත්මක විසඳුම් ලබාදීමටත්, සමාජයේ සමාජ විරෝධි ක්‍රියාකාරකම් වලට හා අවධානමට ලක්වී ඇති පුද්ගලයන් එයින් මුදාගැනිම හා සැමට සෞඛ්‍යාරක්ෂිත ජීවන රටාවක් ලඟා කර දීමත්, පරිසර සංවේදී සමාජයක් බිහිකිරිමත් මෙමඟින් අපේක්ෂා කරනු ලබයි.

එසේම මෙම ප්‍රජාවන් අතර සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ඔවුන්ගේ සමාජ තත්ත්වයන් වැඩිදියුණු කිරිම සඳහා ප්‍රජාවන්, පුද්ගලයන් සහ ප්‍රජා මූලික සංවිධාන බල ගැන්වීමට කටයුතු කිරිමත් සක්‍රීය ප්‍රජා සහභාගීත්වය තුළින් ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරිම සහ තිරසාර සංවර්ධනය සඳහා නාගරික අඩු පහසුකම් සහිත ප්‍රජාව සවිබල ගැන්වීම මෙම වැඩසටහන තුලින් සිදු කරනු ලබන අතර, 2024 වර්ෂයේ දී එය උප අනු වැඩසටහන් 05 ක් ඔස්සේ පහත පරිදි ක්‍රියාවට නංවනු ලැබීය.

### 1.1 ප්‍රජා සමිති ස්ථාපිත කිරිම හා යාවත්කාලීන කිරිම

ස්වශක්තියෙන් නැගී සිටින ප්‍රජාවක් ගොඩනැගීමේදී බිම් මට්ටමේ සිට ප්‍රජාව සංවිධාන ගත කිරීමේ න්‍යායාත්මක බලයක් හිමි සංවිධානයක් ලෙස ප්‍රජා මුල සංවිධාන (CBO) හැදින්විය හැකි අතර, එය තිරසාර බව සහතික කරන බැවින් ප්‍රජා සංවර්ධනයේ තීරණාත්මක අංගයක් වේ.

ඒ අනුව, මෙම වසරේ දී තෝරාගත් මහල් නිවාස සංකීර්ණයන් 05 ක ප්‍රජා මූල සංවිධාන 05 ක් හා රත්නපුරය මාදම්පේ ජනාවාසයේ ප්‍රජා මූල සංවිධානයක් පිහිටුවන ලද අතර, ඒවා පවත්වාගෙන යාම සඳහා මූලික තාක්ෂණික දැනුම සහ අවශ්‍ය මඟපෙන්වීම මෙම වැඩසටහන තුළින් ලබාදෙනු ලැබීය.

### 1.2 කුඩා කණ්ඩායම් වැඩසටහන (මුදල් කළමනාකරණය)

මෙම වැඩසටහන යටතේ ප්‍රජාවගේ හඳුනාගත් අවශ්‍යතාවයක් ලෙස ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම කුඩා කණ්ඩායම් ක්‍රමවේදය ඔස්සේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වලින් බලපෑමට ලක් වී ඇති කාන්තාවන් හා ඔවුන්ගේ කුටුම්භයන් මූලික කරගනිමින් කුටුම්භ ශක්තිමත් කිරීම, සහයෝගී ආර්ථික රටාවක් ගොඩනැංවීම මූලික අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන අතර, මෙහිදී ජනාවාස 15 ක කුඩා කණ්ඩායම් 24 ක් මේ වන විට ආරම්භ කර ඇත.

### 1.3 මත් ද්‍රව්‍ය නිවාරණය හා පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ වැඩසටහන

නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසයන්හී ක්‍රියාත්මක කරන ලද "මතින් නිදහස් ජනාවාසයක්" වැඩසටහන, ප්‍රජාව තුළ වර්ධනය වන මත්ද්‍රව්‍ය, මධ්‍යසාර හා දුම්වැටි භාවිතය අවම කිරීම හා යොමුවීම වැළැක්වීම වෙනුවෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ (ADIC) සම්පත් දායකත්වය ඇතිව ළමා සමිති හා තරුණ සමිති ඒකාබද්ධකර ගනිමින් දැනුවත් කිරීමේ සහ ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම තුළින් මත්ද්‍රව්‍ය, මධ්‍යසාර හා දුම්වැටි භාවිතය තුළින් සිදුවන්නා වූ සමාජ, ආර්ථික හා සෞඛ්‍ය ගැටළු අවම කිරීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ළමුන් හා යෞවනයන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ අවබෝධය පුළුල් කිරීම හා ක්‍රියාකාරී නිවාරණ වැඩ සැලැස්මක් සකස් කිරීම සඳහා නායකත්ව පුහුණු කඳවුරු පවත්වන ලදී. එමෙන්ම ක්‍රියාකාරී මත්ද්‍රව්‍ය නිවාරණ තරුණ කණ්ඩායම් ආයතනයට ගෙන්වා ඔවුන් විසින් මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්හි ප්‍රගතිය හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරන ලදී.

තවද මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ (ADIC) නිලධාරීන් ජනාවාසයන් වෙත ගොස් තරුණ කණ්ඩායම් හා ළමා සමිති සාමාජිකයින් මසකට වරක් දැනුවත් කිරීම්, විවිධ වැඩසටහන් සඳහා සම්බන්ධ කිරීම්, ළමා සමිති අතර තරග පැවැත්වීම ආදී වූ වැඩසටහන් සඳහා සම්බන්ධ කර ගැනීම සිදුවේ.

## 1.4 ප්‍රජා සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ නව යෞවන යෞවනියන්ගේ සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලද අතර, ඔවුන් සඳහා සනීපාරක්ෂක කට්ටල ලබාදීම ද සිදුකිරීම අදාළ ප්‍රදේශයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ නිළධාරීන්ගේ දායකත්වයෙන් සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) අනුග්‍රාහකත්වයෙන් සිදුකරනු ලබයි.

සෞඛ්‍යය ප්‍රවර්ධන කාර්යංශයේ අධීක්ෂණය යටතේ "සුවෙන් සිටිමු ලස්සන වෙමු" "සුවැති දියණී" ආදී පොත් යුගලක් මුද්‍රණය කර එම වැඩමුළු සඳහා සහභාගීවන යෞවන යෞවනියන් හට ලබාදෙනු ලබන අතර, වයස අවුරුදු 05 ට අඩු ඌන පෝෂණය සහිත දරුවන් හා ඌන පෝෂණය සහිත ගර්භනී මවුවරුන්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම වෙනුවෙන් දැනුවත් කිරීම හා ඔවුන් හට සුදුසු පෝෂනීය වියලි ආහාර ද්‍රව්‍ය අඩංගු පාර්සලය සමග සනීපාරක්ෂක සේදුම්කාරක කට්ටලයක්ද ලබාදුන් අතර, ඒ සඳහා අනුග්‍රහකත්වය UNICEF විසින් සිදුකරනු ලැබිය.

එමෙන්ම සෞඛ්‍යය ප්‍රවර්ධන කාර්යාංශය, වතු හා නාගරික සෞඛ්‍යය ඒකකය හා UNICEF ඒකාබද්ධව පෙර පාසල් ළමුන් හට පෝෂණය සම්බන්ධ දැනුවත් කිරීම් හා අඩු වියදමින් පෝෂණීය ආහාර වේලක් සැකසීම සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජනාවාසවල ජීවත් වන යෞවනියන්ගේ මානසික සෞඛ්‍ය යහපත් කිරීමේ අරමුණින් සෞඛ්‍යමත් දිවියක් සහ වගකිව යුතු තාරුණ්‍යයක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබීය.

කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන නිළධාරීගේ සහභාගීත්වයෙන් දන්ත සායන වැඩසටහන් සිදු කරන ලද අතර, ඒ පිලිබඳව දැනුවත් කිරීම් සිදුකර වැඩිහිටියන්ගේ හා ළමුන්ගේ දත් පිරිසිදු කිරීම සිදු කර වැඩිදුර ප්‍රතිකාර සඳහා යොමු කල යුතු පිරිස් සායන සඳහා ද යොමු කර අතර, කොලොන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ වෛද්‍යවරුන්ගේ හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වයස අවුරුදු 35 ට වැඩි ප්‍රජාව සඳහා දියවැඩියාව, කොලෙස්ටරෝල්, අක්ෂි පරීක්ෂාව හා දන්ත පරීක්ෂා කිරීමේ සායන සිදු කරන ලදී.

එමෙන්ම ගංවතුරෙන් යටවූ නිවැසියන් හට එම නිවෙස් පිරිසිදු කර ගැනීම සඳහා සනීපාරක්ෂක ආධාර ලබා දෙන ලද අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජාවෛද්‍ය අංශයේ හා හෙල්ප් ඒජ් ආයතනයේ මැදිහත්වීමෙන් වයස අවුරුදු 55 වැඩිහිටියන්ගේ ඇස් පරීක්ෂාව මගින් ඇස් කණ්ණාඩි ලබා දීම හා ඇසේ සුද ඉවත් කිරීමේ වැඩසටහනක් ද සිදු කරන ලදී.

UNICEF ආයතනයේ මැදිහත් වීම මත ප්‍රජාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වෙනුවෙන් සබන් නිෂ්පාදනය පුහුණු කිරීමේ වැඩසටහන් සිදු කරමින් පවතී.

## 1.5 දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ වැඩසටහන

පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ආයතනයේ සම්පත් දායකත්වය මත දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම වෙනුවෙන් ජනාවසයන්හි දරු දැරියන්ගේ සහභාගීත්වයෙන් පරිසර කමිටු පිහිටුවීම, පරිසර හිතකාමී ජීවන රටාව, ජලය සුරැකීම, බලශක්තිය ඉතිරි කිරීම හා අපද්‍රව්‍ය විධිමත් අයුරින් බැහැර කිරීම පිළිබඳව මහල් නිවාස ආශ්‍රිත දරුවන් අධ්‍යාපනය ලබන පාසල් වල ද දැනුවත් කිරීම සිදු කරන ලදී.

එසේම දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා දායක වීමට අදාළ පහත සඳහන් කර ඇති ප්‍රායෝගික වැඩසටහන් ද දියත් කරනු ලැබීය.

- රුක්රෝපණ වැඩසටහන
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන
- ශ්‍රමදාන වැඩසටහන

වාර්ෂික ප්‍රගතිය

- 2024 වර්ෂය සඳහා නව මහල් නිවාස සංකීර්ණ 05 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් හඳුනාගැනීම සහ නිරීක්ෂණය සිදුකරන ලදි.
- හඳුනාගත් එම මහල් නිවාස සංකීර්ණ 05 හී ප්‍රජා මූල සංවිධාන 05ක් හා මාදම්පේ ජනාවාසයේ ප්‍රජා මූල සංවිධානයක් ස්ථාපිත කර, ජනාවාස 13 ක ප්‍රජා සංවර්ධන සමිති යාවත්කාලීන කරන ලදී.
- කුඩා කණ්ඩායම් 24 ක් ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ජනාවාස 15 ක ආරම්භ කර එම කණ්ඩායම් සඳහා සාමාජිකයින් 210 ක් සම්බන්ධ විය.
- මත්ද්‍රව්‍ය නිවාරණ පිළිබඳ වැඩමුළු 05 ක් ළමුන් 209 කගේ සහභාගීත්වයෙන් ද, නායකත්ව පුහුණු කඳවුරු 05 තරුණ තරුණියන් 205කුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ජනාවාසයන්හි තරුණ කණ්ඩායම් (තරුණ තරුණියන් 40ක්) පුහුණු වැඩසටහන් 02 ක් සහ පෙර පාසල් පදනම් කර ගත් නිවාරණ වැඩසටහන් 01 ක් ළමුන් 26 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.
- කුඩා කණ්ඩායම් ආශ්‍රිතව නිවාරණ හා මූල්‍ය කළමනාකරණ වැඩසටහන් ජනාවාස 02 ක ප්‍රජාව 22 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක වෙමින් පවතී.
- මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු ජනාවාස මට්ටමින් කණ්ඩායම් 12 ක් ස්ථාපිත කර ඇත.
- සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැඩමුළු 03 ක් සිදුකරන ලද අතර, සහභාගි වූ යෞවනියන් 100 ක් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් කට්ටල ලබාදෙන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අවුරුදු 05 ට අඩු ඌන පෝෂණය සහිත දරුවන් හා ඌන පෝෂණය සහිත ගර්භනී මවුවරුන්හට පෝෂණය සම්බන්ධයෙන් පවත්වන ලද වැඩමුළු 08 දී පෝෂණීය වියලි ආහාර ද්‍රව්‍ය අඩංගු කට්ටල 331 ලබාදෙන ලදි.
- දැත් සේදීම් කටයුතු සම්බන්ධව සහ විෂ බීජ වලින් ආරක්ෂා වීම සඳහා වැඩමුළු 03 ක් පාසල් ළමුන් 324 දෙනෙකු සහභාගීත්වයෙන් සිදුකරනු ලැබූ අතර, ළමුන් 40 කු ගේ සහ වැඩිහිටි ප්‍රජාව **33** දෙනෙකුගේ දන්ත සායන වැඩසටහන් 02ක් සිදු කරන ලදී.
- ප්‍රජාවගේ සෞඛ්‍යය මට්ටම ඉහළ නැංවීම වෙනුවෙන් බෝ නොවන රෝග පරීක්ෂා කිරීමේ සායනයක් පවත්වන ලද අතර මේ සඳහා ප්‍රජාව 61 දෙනෙකු සහභාගී විය.
- ගංවතුරෙන් යටවූ නිවෙස් වෙත සනීපාරක්ෂක ද්‍රව්‍ය කට්ටල 418ක් ජනාවාස 05ක් අතර බෙදන ලදී.
- වයස අවුරුදු 55 ට වැඩි වැඩිහිටියන් 93 දෙනෙකුගේ ඇස් පරීක්ෂාවේ දී ඔවුන්ට ඇස් කණ්ණාඩි ලබා දීම හා ඇසේ සුද ඉවත් කිරීම් මගින් 07ට හා 53ට ඇස් කණ්ණාඩි ලබා ගැනීමට හැකි විය.
- සෞඛ්‍යය හා සනීපාරක්ෂාව වෙනුවෙන් සබන් නිෂ්පාදනය පුහුණු කිරීමේ වැඩසටහන් 02ක් සිදු කරන ලද අතර මේ සඳහා ප්‍රජාව 44ක් සහභාගී විය.
- පාරිසරික වැඩසටහන යටතේ ජනාවාස 17ක දරුදැරියන් 1002 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රුක්රෝපණ සහ ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් ප්‍රජා සමිති හා ළමා සමිති සම්බන්ධ කර ගනිමින් සිදුකරන ලදි.

## ප්‍රජා සංවර්ධන වැඩසටහන් සම්බන්ධ ඡායාරූප

### 1.1 ප්‍රජා සමිති ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම





### 1.2 කුඩා කණ්ඩායම් වැඩසටහන (මුදල් කළමනාකරණ)





### 1.3 මත් ද්‍රව්‍ය නිවාරණය හා පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ වැඩසටහන





### 1.4 ප්‍රජා සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන





### 1.5 දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ වැඩසටහන





## 02. අධ්‍යාපනික වැඩසටහන

තරඟකාරි වෙනස් වන ලෝකයක සාර්ථකත්වය සඳහා ඌණ පහසුකම් සහිත ජනාවාසයන්හි ජීවත්වන ළමුන් තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය හා මානසිකත්වයෙන් යුත් දරුවන් අඩු පහසුකම් ජනාවාස තුළින් බිහිකිරිම මෙම අධ්‍යාපන වැඩසටහනේ ප්‍රධාන අරමුණු වේ.

මෙම වැඩසටහන තුළින් ළමා හිතකාමී අධ්‍යාපනික පරිසරයක් තුල ජීවන කුසලතා සහ දැනුම පෝෂණය කිරිමේ හැකියාව ලැබෙන අතර, එය උප අනු වැඩසටහන් 04 ඔස්සේ පහත පරිදි ක්‍රියාවට නංවන ලදී.

### 2.1 තරුණ හා ළමා සංවර්ධන වැඩසටහන

ළමා හා තරුණ ප්‍රජාව සම්බන්ධ කරගෙන ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ළමා සමිති හා තරුණ සමිති ස්ථාපිත කර එම සමිති හරහා ඔවුන්ගේ මානසික සුවතාවය වර්ධනය කිරීමටත්, ඔවුන්ගේ දැනුම කුසලතා සංවර්ධනය කිරීමටත් සහ ඔවුන් තුල නායකත්ව, පෞර්ෂත්ව ගුණාංග ගොඩනැගීමටත් මේ සම්බන්ධයෙන් විශේෂ දැනුම ඇති සම්පත්දායකත්වයක් උපයෝගී කර ගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙතුළින් දරුවන් වෙත අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලබන අතර, නායකත්ව, පෞර්ෂත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ ප්‍රජාවගේ නායකත්ව මානසික සංවර්ධනය සමාජයට ඇති වීමත්, කාර්යක්ෂම වැඩදායි තරුණ ප්‍රජාවක් බිහි කිරීම සඳහා නායකත්ව පුහුණු වැඩමුළු සහ නිර්මාණ කුසලතාවය ප්‍රවර්ධනය කිරීම සඳහාත්, නව නිර්මාණ කරන ආකාරය පිළිබඳව පුහුණු වැඩසටහන් ඔස්සේ ඔවුන්ගේ සැඟවුණු දක්ෂතා කුසලතාවයන් ඔප් නැංවීමත්, තරුණ ප්‍රජාවගේ මානසික සුවතාවය වර්ධනය කිරීමත් සඳහා නිර්මාණ කුසලතා වැඩසටහන දියත් කරනු ලබයි.

එමෙන්ම සමාජයේ ජීවත්වීමේදී ළමුන් ඉතා පහසුවෙන් අනතුරු වලට හා පීඩාවන්ට ගොදුරු වන අතර එම අවස්ථාවන් කල්තියා හඳුනා ගැනීමට, පෙර සූදානම් වීමට එවැනි තත්වයන් අවම කිරීමට හා ඊට ඔරොත්තුදීමේ ශක්තිය ඇති කිරිමට ළමා ආරක්ෂාව සුරක්ෂිත කිරීම අරමුණු කරගනිමින් ජනාවාසවල දරුදැරියන් හට ළමා අයිතිවාසිකම්, ළමා අපචාර හා එහි නීතිමය පසුබිම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වේ.

### 2.2 පුස්තකාල ස්ථාපිත කිරීම

මෙහිදි ජනාවාසයන්හි ළමා සමිති පිහිටුවීම හරහා ළමුන් හා තරුණ ප්‍රජාව පොත් පත් කියවීමට යොමු කිරීමටත්, අධ්‍යාපනික අවශ්‍යතාවයන් සපුරාලීමට හා ඒ තුලින් දැනුම, කුසලතා, ආකල්ප ගොඩ නැංවීම සඳහාත්, විෂයය බාහිර පොත් පරිහරණය කිරීම මඟින් ළමුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කර ගැනීමේ අරමුණින් ළමා පුස්තකාල පිහිටුවීම සිදු කරනු ලබයි. මහ නගර සභා වලට අයත් පුස්තකාල වලින් ඉවත් කරන ලද, නමුත් භාවිතයට සුදුසු විෂයානුබද්ධ හා විෂය පරිබාහිර පොත් සහ සාහිත්‍ය මාසය වෙනුවෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැත්වූ පොත් ප්‍රදර්ශනයෙන් ද මේ සඳහා අවශ්‍ය වන පොත් මෙලෙස ස්ථාපිත කරන ලද පුස්තකාල සඳහා පිරිනමනු ලැබීය.

### 2.3 අධ්‍යාපනිකව දැනුවත් කිරීමේ වැඩසටහන

ජනාවාසයන්හි වෙසෙන දූවාදරුවන් ආර්ථික අපහසුතාවයක් හා අවම පහසුකම් යටතේ අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබන අතර, ඔවුන් දිරි ගැන්වීම උදෙසා 'අධ්‍යාපනික' වැඩසටහන ක්‍රියාත්මක වේ. ජනාවාස දරු දැරියන්ගේ අඛණ්ඩ ප්‍රාථමික අධ්‍යාපනයට අවශ්‍ය සහය ලබා දීම හරහා අධ්‍යාපනික කුසලතා ප්‍රවර්ධනය කිරීම මෙතුළින් සිදු කෙරේ. ජාතික නිදහස් දින උත්සවයට සමගාමීව ළමුන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ජනාවාස මට්ටමින් ජාතික නිදහස් දින උත්සව සංවිධානය කරන ලදී. මෙහිදී ළමුන්ගේ දැනුම වර්ධනය කිරීමේ තරඟ පවත්වා එමඟින් ජයග්‍රහණය කල ළමුන් හට කුසලතා ඇගයීමක් ද සිදු කරන ලදී.

අඩු අදායම්ලාභී පවුල්වල ළමුන්ගේ අඛණ්ඩ පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පාසල් පාවහන් මිලදී ගැනීම සඳහා වවුචර්පත් හා පාසල් උපකරණ ලබා දෙනු ලැබීය.

මේ යටතේ පාසල් නොයන දරුවන්, ලිවීමේ කියවීමේ හැකියාව නොමැති දරුවන්, පාසල් අධ්‍යාපනයට සමගාමීව අමතර අධ්‍යාපනයක් ලැබිය යුතු දරුවන් හා ආර්ථික අපහසුතා හේතුවෙන් අධ්‍යාපන අවස්ථා අහිමි වූ දරුවන් කෙරෙහි අවධානයක් යොමු කිරීම සිදු කෙරේ. එම ළමුන් හට සමාජ සජීවීකරණ අංශයේම නිළධාරීන් විසින් අමතර පන්ති පවත්වා ඔවුන්ගේ දැනුම හා සාක්ෂරතාව වර්ධනය කිරීමට කටයුතු සිදු කරනු ලබයි. මෙහිදී අඛණ්ඩව පාසල් නොයන දරුවන් හඳුනාගෙන ඔවුන්ගේ දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීම හරහා නිවාස මට්ටමින් එම ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගනු ලබයි.

දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාව හා විචාරශීලී චින්තනය ඇති කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම්, විවාද තරඟ, ප්‍රශ්න පත්‍ර ලබා දීම, ක්‍රීඩා තරඟ පැවැත්වීම ආදී වැඩසටහන්ද මෙම වැඩසටහන තුලින් සිදු කෙරේ.

තවද ජනාවාසයන්හි අඩු අදායම්ලාභී දහම් අධ්‍යාපනය ලබන ළමුන් සම්බන්ධ කර ගනිමින් එම ළමුන්ගේ අඛණ්ඩ දහම් අධ්‍යාපනය වෙනුවෙන් දහම් පාසල් නිල ඇඳුම් ලබා දීම සිදු කරන ලදී. 2024 වර්ෂයේ ශිෂ්‍යත්වය සඳහා පෙනී සිටින ළමුන් සම්බන්ධ කර ගනිමින් එම ළමුන් විභාගය සඳහා මුහුණ දීමේ ක්‍රමවේදය, ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු තාර්කිකව විසඳීමේ ක්‍රමවේදයන් මෙන්ම, චින්තන හැකියාව වර්ධනය කිරීම හා අභියෝග ජය ගැනීම සඳහා ළමුන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා ප්‍රවීණ සම්පත්දායකයකු සම්බන්ධ කර ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඔස්සේ ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කිරීම් සිදු කරන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ ජනාවාසයන්හි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විශාල දායකත්වයක් ලබා දුන් ගම්පහ සෙනරත් පරණවිතාන ජාතික පාසලේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පහසුවෙන් හා නවීන තාක්ෂණය භාවිතයෙන් වඩාත් ඵලදායීව සිදු කිරීමට විදුහල්පතිතුමන්ගේ ඉල්ලීමකට අනුව සුහුරු පන්ති කාමරයක් ද ආරම්භ කරන ලදී.

එමෙන්ම තරුණ තරුණියන් සම්බන්ධ කර ගනිමින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු තාර්කිකව විසඳීමේ ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

නාගරික ජනාවාසයන්හි පාසල් යායුතු වයසේ එහෙත් විවිධ හේතුමූලික කර ගනිමින් අතරමඟ පාසල් යාම නතර කරන ලද ළමුන් නැවත පාසල් අධ්‍යාපනය සඳහා යොමු කිරීම සමාජ සංවර්ධන වැඩසටහනෙහි එක් පියවරකි. මෙම අඩු අදායම්ලාභී පවුල්වල ළමුන් හඳුනාගෙන ඔවුන් ජනාවාස අවට පාසල්වලට යොමු කරන ලදී. නමුත් ඔවුන්ගෙන් බහුතරයකට අධ්‍යාපන උපකරණ මිලදී ගැනීමේ අපහසුතා පැවති හෙයින් පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී .

## 2.4 කෙටි කාලීන වෘත්තීය පුහුණුව හා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

ජනාවාසවල තරුණ තරුණියන් නිසි අධ්‍යාපනයක් නොලැබීමත්, නිසි වෘත්තිය පුහුණුවක් නොලැබීමත් සහ ඔවුන්ගේ නොසැලකිල්ලත් හා වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් ඇති අධ්‍යාපනික ආයතන පිළිබඳ නොදැනුවත්භාවය හේතුවෙන් රැකියා විරහිතව නිකරුනේ කාලය ගත කරනු ලබයි. මේ හේතුවෙන් මෙම තරුණ ප්‍රජාව වෘත්තිය සුදුසුකම් සහිත තරුණ ප්‍රජාවක් බවට පත් කිරීමටත් ඒ ඔස්සේ රැකියාවන්ට යොමු කිරීමටත් අත්වැලක් සැපයීමේ පරමාර්ථය ඇතිව මෙම වැඩසටහන දියත් කිරීම සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ පාඨමාලාවන් තෝරා ගත යුතු ආකාරය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය.

වාර්ෂික ප්‍රගතිය

- ජනාවාස ළමුන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීම උදෙසා ශක්තිමත් වූ ළමා සමාජ ගොඩනඟමින් එම ළමා සමාජ තිරසාරව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව ළමා සමාජ 07 ක් ස්ථාපිත කිරීම හා සමිති 10 ක් යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.
- නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් 09 ක් ජනාවාසයන් තුල සිදු කරන ලද අතර ළමුන් 331 දෙනෙක් එම වැඩසටහන් සඳහා සහභාගී විය.
- ළමා ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කඩුවෙල - වැලිහිඳ ජනාවාසයේ දූදරුවන් එම ජනාවාසයේදීම විවිධප්‍රසංගයක් සූදානම් කර ඉදිරිපත් කරන ලද නර්තන වෙනුවෙන් සහතික පත් 45 දෙනෙකු වෙත ප්‍රදානය කිරීම.
- දරු දැරියන්ගේ නිර්මාණ කුසලතාවය ප්‍රවර්ධනය කිරීම සඳහාත්, නව නිර්මාණ කරන ආකාරය පිළිබඳව පුහුණු වැඩසටහන් 07 ක් සිදු කරන ලද අතර, ඒ සඳහා ළමුන් 124 දෙනෙකු සම්බන්ධ විය.
- ළමා ආරක්ෂාව සුරක්ෂිත කිරීම අරමුණු කර ගනිමින් ජනාවාසවල ජීවත් වන දරුදැරියන් හට ළමා අයිතිවාසිකම්, ළමා අපචාර හා එහි නීතිමය පසුබිම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් සිදු කරන ලද අතර ඒ සඳහා ළමුන් 188 දෙනෙකු සම්බන්ධ විය.
- දැනුම, කුසලතා, ආකල්ප ප්‍රවර්ධනය කිරීම උදෙසා ළමා ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ජනාවාසයේ පොදු ආරක්ෂිත ස්ථානයක් තෝරාගෙන ළමා පුස්තකාල 10 ස්ථාපිත කිරීම සිදු කරන ලද අතර, එමඟින් ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාර වේ.
- ජාතික නිදහස් දින උත්සවයට සමගාමීව ළමුන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ජනාවාස මට්ටමින් පවත්වන ලද ජාතික නිදහස් දින උත්සව වැඩසටහන් ජනාවාස 03ක ළමුන් හා ප්‍රජාව 254 දෙනකු සහභාගීත්වයෙන් සිදු කරන ලදී.
- දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාව හා විචාරශීලී චින්තනය ඇති කිරීම සඳහා රචනා තරගයක් සිදු කල අතර ඉන් ජයග්‍රණය කල ළමුන් තිදෙනාට DSI වවුචර්පත් ලබා දෙන ලදී.
- අඩු අදායම්ලාභි පවුල්වල ළමුන්ගේ පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පාසල් පාවහන් මිලදී ගැනීම සඳහා වවුචර්පත් 80 ළමුන් සඳහා ලබාදෙන ලදී.
- ළමුන් 20 අඛණ්ඩ දහම් අධ්‍යාපනය වෙනුවෙන් දහම් පාසල් නිල ඇඳුම් ලබා සිදු කරන ලදී.
- 2024 වර්ෂයේ ශිෂ්‍යාත්වය සඳහා පෙනී සිටින ළමුන් සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් 05 ක් සිදු කරන ලද අතර, ඒ සඳහා ළමුන් 455 දෙනෙකු සම්බන්ධ විය.
- පාසල් යාම නතර කරන ලද ළමුන් 13 නැවත පාසල් අධ්‍යාපනය සඳහා යොමු කිරීම සිදු කරන ලදී. ( සංහිඳ සෙවන නිවාස සංකීර්ණයේ ළමුන් 02 , මුවදොර උයන නිවාස සංකීර්ණයේ ළමුන් 02 හා අඟුලාන සයුරුපුර නිවාස සංකීර්ණයේ ළමුන් 09 දෙනෙකු )
- ජනාවාසයන්හී ජීවත් වන දරු දැරියන්ගේ අඛණ්ඩ ප්‍රථමික අධ්‍යාපනයට අවශ්‍ය සහය ලබා දීම වෙනුවෙන් පෙර පාසල් උපකරණ ළමුන් 40 දෙනෙකුට ලබා දෙන ලදී.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ පාඨමාලාවන් තෝරා ගත යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් තරුණ ප්‍රජාව 99දෙනෙකු ඒ සඳහා සහභාගි වූ අතර, වෘත්තිය පුහුණු පාඨමාල සඳහා ඉන් 10 දෙනෙකු යොමු කරන ලදී. 16 දෙනෙකු මැහුම් පාඨමාලාව හදාරමින් සිටී.

## අධ්‍යාපනික වැඩසටහන් සම්බන්ධ ඡායාරූප

### 2.1 තරුණ හා ළමා සංවර්ධන වැඩසටහන





### 2.2 පුස්තකාල ස්ථාපිත කිරීම





### 2.3 අධ්‍යාපනිකව දැනුවත් කිරීමේ වැඩසටහන





### 2.4 කෙටි කාලීන වෘත්තීය  පුහුණුව හා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන





## 03. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ප්‍රජාවගේ ආර්ථික යහපැවැත්ම නංවාලීම මෙහි අරමුණයි. ප්‍රජාව මත පදනම් වූ කුඩා පරිමාණ නිෂ්පාදන ආර්ථිකයන්, සංවර්ධනය කිරීම සහ හුදකලා වූ ආන්තික ප්‍රජාවන් අතර සැඟව ඇති කුඩා පරිමාණ නිෂ්පාදන එළිදැක්වීමේ වැදගත් යාන්ත්‍රණයක් ලෙස මෙම වැඩසටහන හඳුන්වා දිය හැකිය.

කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීම, නව නිෂ්පාදන හඳුන්වා දීම, ඔවුන්ට මූල්‍ය ණය පහසුකම් සපයා දීම සහ වෙළඳපල අවස්ථා හඳුන්වා දෙමින් නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල ප්‍රජාව ආර්ථිකමය වශයෙන් සවිබල ගන්වමින් ඔවුන්ට ශක්තියක් වීම මෙතුළින් අපේක්ෂා කරනු ලබන අතර, එය උප අනු වැඩසටහන් 04 ඔස්සේ පහත පරිදි ක්‍රියාවට නංවනු ලැබීය.

### 3.1 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව

**(සම්පත් ගාස්තු, පුහුණු, ද්‍රව්‍ය, පරිපාලන, පිරිවැය)**

### 3.2 ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන

කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අනාගත ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනා ගනිමින් නාගරික ජනාවාසයන්වල ස්වයං රැකියාවන් හි නිරත සහ නව ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින පුද්ගලයින්ට අවශ්‍ය තාක්ෂණික දැනුම, මූල්‍ය සහය සහ මඟපෙන්වීම ලබා දෙමින් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට, දිරිගැන්වීමට සහ ප්‍රවර්ධනය කිරීමට උපකාර වන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සිදුකරන ලදී.

අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ශ්‍රමය ඵලදායී ලෙස යොදා ගනිමින් ආර්ථිකය නගාසිටුවීමත්, ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරිමත් මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. ප්‍රජාවගේ අවශ්‍යතාවයන් පරිදි ඇඳුම් මැසීමේ පුහුණු, සබන් නිෂ්පාදන පුහුණු, පහන්තිර නිෂ්පාදන පුහුණු, අත් සෝදන දියර සහ භාජන සේදුම් කාරක නිෂ්පාදනය හා බතික් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වන ලදී.

එමෙන්ම පවතින ආර්ථික අර්බුදය ජයගැනීමට ස්වයං රැකියා හඳුන්වා දෙමින්, ඒවා පවත්වාගෙන යන ආකාරය පිළිබඳ, වෙළඳපල සකස්කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදී. විද්‍යා සම්පත් මධ්‍යස්ථානය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය, කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදී රාජ්‍ය ආයතන මේ සඳහා අවශ්‍ය සම්පදායකත්වය ලබාදෙන ලදි.

### 3.3 නව/ පවත්නා ක්ෂුද්‍ර / කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආධාර හා මූල්‍යාධාර සැපයීම. (රු.25,000 x 50 ණය 10% වාර්ෂික පොලියත් සමඟ)

නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර පුළුල් කිරීමට කැමති ව්‍යවසායකයින් සඳහා කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සහනදායී අඩු පොලී අනුපාත සහිත ණය යෝජනා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. එම ප්‍රජාවට ස්වයං උත්පාදන රැකියාවක් ආරම්භ කිරීමට කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා පුහුණු වැඩසටහන් හරහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ලදි.

## 3.4 ව්‍යවසායකයින් පසුවිපරම් කිරීම

ස්වයං රැකියා ආරම්භ කිරීම, පවත්වාගෙන යාම පිළිබඳ පවත්වන ලද වැඩමුළු හා පුහුණු වීම් ආශ්‍රයෙන් ව්‍යවසායකයින් විසින් තරඟකාරී වෙළඳපල තුල තම නිෂ්පාදන ගුණාත්මක භාවයෙන් යුක්තව පාරිභෝගිකයාට ඉදිරිපත් කිරීමට පසුබිම සැකසීම මෙම වැඩසටහනින් සිදු වේ. මෙහිදී දැනුම ලබා ගැනීමෙන්, පුහුණු වීම් හා මූල්‍ය ණය ලබා ගැනීමෙන් පසු ස්වයං රැකියාව ව්‍යවසායකයාගේ ආර්ථිකයට බලපාන ආකාරය හා එය පවත්වාගෙන යන ආකාරය පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

කුඩා ව්‍යාපාරිකයින්ට තම නිෂ්පාදන පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට හඳුන්වා දීමට සහ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට වෙළඳපල හඳුන්වාදීම සහ සංවිධානය කිරීම මඟින් එවැනි කුඩා ව්‍යාපාරිකයින්ට සහාය වීමට අප අධිකාරියේ මැදිහත් වීම ලබාදෙනු ලබයි. ව්‍යවසායකයාට තරගකාරී වෙළඳපල තුල තම නිෂ්පාදන ගුණාත්මක භාවයෙන් ඉදිරිපත් කිරීමට, තම නිෂ්පාදන සඳහා ඇනවුම් ලබා ගැනීමට, පවතින ආර්ථික රටාව තුල ආර්ථිකය ශක්තිමත් කිරීමට, නිෂ්පාදන සඳහා අගයක් ලබා දීමට මෙම වෙළඳපල පැවැත්වීම තුළින් අවස්ථාව හිමි වේ.

ඒ අනුව 2024 වර්ෂයේ සැප්තැම්බර් 30 සහ ඔක්තෝම්බර් 01 යන දෙදින සෙත්සිරිපාය පරිශ්‍රය තුළ "ව්‍යවසායකත්ව වෙළඳ ප්‍රදර්ශනය" සිදුකළ අතර, ඒ සඳහා අප අධිකාරියේ මූල්‍යමය ණය ලබාගත් ව්‍යවසායකයින් මෙන්ම ආයතනය ඔස්සේ පැවති ස්වයං රැකියා පුහුණු වැඩමුළු සඳහා සහභාගී වූ ව්‍යවසායකයින්ගේ සංකලනයකින් යුක්තව මෙම වෙළඳ ප්‍රදර්ශනය පවත්වන ලදී. එහි දී නිෂ්පාදන සහ ආහාර යන දෙඅංශයෙන්ම ව්‍යවසායකයින් සම්බන්ධ වූ අතරම ඔවුන් දිරිගැන්වීම වෙනුවෙන් අනුග්‍රාහකභවතුන්ගේ මැදිහත්වීම ලබාගනිමින් ත්‍යාග ලබාදීම සිදුකලේය. එමෙන්ම ඉහත දෙඅංශය ඔස්සේ පරිසර හිතකාමී සහ දේශීය නිෂ්පාදනයන් ඉදිරිපත් කළ ජයග්‍රාහකයින් හට සහතික පත්‍ර, කුසලාන සහ ත්‍යාග පිරිනැමීම සිදුකරන ලදි.

**වාර්ෂික ප්‍රගතිය**

- ප්‍රජාව 85 දෙනෙකු සඳහා ස්වයංරැකියා වැඩසටහන පිළිබඳ මූලික දැනුවත් කිරීම් සිදුකිරීම.
- ව්‍යවසායකයින් 190 දෙනෙකු සඳහා පුහුණු වැඩමුළු පවත්වන ලදි.
  - පහන්තිර නිෂ්පාදනය, සබන් නිෂ්පාදන පුහුණු, බතික් නිෂ්පාදන පුහුණු, ගැඩවිල් පොහොර නිෂ්පාදන පුහුණු, මැහුම් පුහුණු (කොළඹ, ගම්පහ, නුවරඑළිය, රත්නපුරය දිස්ත්‍රික්කයන්හි පුහුණු වැඩසටහන් පවත්වන ලදී.)
- ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ව්‍යවසායකයින් 13 දෙනෙකු සඳහා ණය ලබා දීම.
- ස්වයංරැකියා ලාභීන් දිරිගැන්වීම සහ වෙළඳපොළ අවස්ථා හඳුන්වාදීමේ අරමුණ ඇතිව වර්ෂ අවසාන වෙළඳ ප්‍රදර්ශනය සැප්තැම්බර් 30 සහ ඔක්තෝම්බර් 01 දෙදින සෙත්සිරිපාය පරිශ්‍රය තුළ ව්‍යසායකයින් 45 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදි.

## ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සම්බන්ධ ඡායාරූප

### 3.1 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව (සම්පත් ගාස්තු, පුහුණු, ද්‍රව්‍ය, පරිපාලන, පිරිවැය)






### 3.2 ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන



### 3.3 නව/ පවත්නා ක්ෂුද්‍ර / කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආධාර හා මූල්‍යාධාර සැපයිම.

(රු.25,000 x 50 ණය 10% වාර්ෂික පොලියත් සමඟ)




### 3.4 ව්‍යවසායකයින් පසුවිපරම් කිරීම






## 04. ආගමික, සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

ලාංකීය ආගමික හා සංස්කෘතිය කලාවන් පිළිබඳව නූතන තරුණ පරපුර තුල නැඹුරුතාවයක් ඇති කිරිම සහ කලා කුසලතාවයන් ඇති තරුණ තරුණියන් හට නව මංපෙත් විවර කරදෙමින් නූතන ලෝකයට සරිලන කලා කුසලතාවයන්ගෙන් පිරිපුන් සංවේදී පුද්ගලයෙකු බිහිකිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව ඇති නාගරික ජනාවාස වල පදිංචි තරුණ පරපුර හා ළමා පරපුර ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර, එය පහත උප අනුව වැඩසටහන් 02 හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

4.1 සංස්කෘතික හා ආගමික වැඩසටහන

4.2 ජයග්‍රාකයින් ඇගයිම

මෙහිදී ජාතීන් අතර ආගමික සහජීවනය ඇති වීම හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති වීම වෙනුවෙන් ජනාවාස මට්ටමින් වැඩසටහන් පවත්වන ලදී. ළමුන් අතර ජාතික අභිමානය ඇති කිරීම හා ළමුන්ගේ කුසලතා හැකියාවන් වර්ධනය කිරීම වෙනුවෙන් මෙම සංස්කෘතික සහ ආගමික වැඩසටහන ක්‍රියාත්මක වේ.

ජනාවාසන්හි ජීවත්වන ආඩු ආදායම්ලාභී දහම් අධ්‍යාපනය ලබන ළමුන්ගේ දහම් අධ්‍යාපනය නැංවීම, සංස්කෘතික සහ ආගමික කුසලතා ඇගයීම වෙනුවෙන් එම ළමුන් හට ත්‍යාග ලබාදීම සිදුකරන ලදී.

ළමා සමිති, තරුණ සහ වැඩිහිටි සමිති එකතුවීමෙන් ජනාවාසයන් තුල බක්මහ උළෙල සංවිධානය කර පවත්වන ලදී. ජාතීන් අතර ආගමික සහ සංස්කෘතික සහජීවනය ඇති වීම, ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති වීම හා ළමුන්ගේ නිර්මාණශීලිත්වය සහ කුසලතාවයන් වැඩිදියුණු වීම වෙනුවෙන් මෙම වැඩසටහන් සංවිධානය කෙරේ.

ප්‍රජා සමිති, ළමා සමිති හා වැඩිහිටි සමිති මඟින් වෙසක් කූඩු හා භක්ති ගී තරඟාවලි සංවිධානය කර පවත්වන ලද අතර, එමෙන්ම දන්සල් හා ධර්ම දේශනා පින්කම්ද වෙසක්, පොසොන් පොහොයන් වෙනුවෙන් ජනාවාස මට්ටමින් සිදු කරන ලදී. ළමුන් හා ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ළමුන්ගේ කලා කුසලතාවයන් හඳුනා ගැනිමට විවිධ තරඟ ඉසව් සහිත රසවින්දනාත්මක වැඩසටහන් පවත්වනු ලැබීය.

2024 වර්ෂය සඳහා ලෝක ජනාවාස දිනය සැමරුම අරමුණු කරගනිමින් දිවයිනම ආවරණය වන පරිදි නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි දූවා දරුවන්ගේ නිර්මාණශීලී කුසලතාවය හා ළමා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ළමා නර්තන තරඟයක් පවත්වනු ලැබීය. මෙහිදී එක් නර්තන කණ්ඩායමක් සඳහා ළමුන් 4-12 ත් අතර සංඛ්‍යාවක් සහභාගී වූ අතර, ඔවුන් හට නව නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා විය. මෙම නර්තන තරඟාවලිය සඳහා ළමුන් තම ජනාවාසය තුලදී ඉතා උනන්දුවෙන් පුහුණු වීම් සඳහා සහභාගී වූ අතර, නර්තන තරඟාවලියේදී තම නර්තනය නිර්මාණශීලීව ඉදිරිපත් කරන ලදී.

මෙම නර්තන තරඟය විනිශ්චය කිරීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් සහභාගී විය. කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, රත්නපුරය යන දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ජනාවාස මට්ටමින් නර්තන කණ්ඩායම් 30 ක් මෙම වැඩසටහන සඳහා සහභාගී විය. ඉන් පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගත් ළමා නර්තන කණ්ඩායම් වෙත ලෝක ජනාවාස දින සැමරුම් උත්සවයේදී සහතික පත්, කුසලාන ලබා දෙන ලදී.

**වාර්ෂික ප්‍රගතිය**

- ජාතීන් අතර ආගමික සහජීවනය ඇති කිරීම හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් ආගමික වැඩසටහන් පවත්වන ලදී . මේ සඳහා ප්‍රජාව 85 දෙනෙකු සහභාගී විය.
- ළමුන් අතර ජාතික අභිමානය ඇති කිරීම හා ළමුන්ගේ කුසලතා හැකියාවන් වර්ධනය කිරීම වෙනුවෙන් නිදහස් දින උත්සවය සැමරීම සහ විවිධ ප්‍රසංග පැවැත්වීම සිදු කරන ලද අතර ජනාවාස 03 ක ළමුන් හා වැඩිහිටියන් 70 දෙනෙකු සහභාගී විය.
- දහම් අධ්‍යාපනය ලබන ළමුන්ගේ දහම් අධ්‍යාපනය නැවීම, සංස්කෘතික සහ ආගමික කුසලතා ඇගයීම වෙනුවෙන් ළමුන් 150 දෙනෙකු සඳහා ත්‍යාග ලබාදීම සිදුකරන ලදී.
- ජනාවාස 09 ක අප්‍රේල් මස දී සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව සංවිධානය කල අතර, මේ සඳහා ළමුන්, තරුණයින් හා වැඩිහිටි ප්‍රජාව 1610 දෙනෙකු සහභාගී විය.
- ජනාවාස මට්ටමින් ළමා සමිති, ප්‍රජා සමිති හා වැඩිහිටි සමිති එක්ව වෙසක් කුඩු ප්‍රදර්ශන, භක්ති ගී තරඟාවලි සංවිධානය කර පවත්වන ලදී. එමෙන්ම දන්සල් හා ධර්ම දේශනා පින්කම්ද සංවිධානය කල අතර මෙම වැඩසටහන් සඳහා ප්‍රජාව 810 දෙනෙකු ජනාවාස 11 කින් සම්බන්ධ විය.
- දහම් අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තාවකාලිකව නවතන ලද රත්ගම රලජයපුර දහම් පාසල නැවත ආරම්භ කිරීම. මේ සඳහා ළමුන් 40 දෙනෙකු නැවත අධ්‍යාපනය ලැබීමට සම්බන්ධ වන ලදී.
- ළමුන්ගේ හැකියාවන් හා කලා කුසලතාවයන් හඳුනා ගැනීමට පවත්වනු ලැබූ රසවින්දනාත්මක වැඩසටහන සඳහා ළමුන් 63 ක් හා ප්‍රජාව 19 දෙනෙකු සහභාගී විය.
- ළමා නර්තන තරඟාවලිය සඳහා කණ්ඩායම් 30 ක් සහභාගී වූ අතර, ළමුන් 300 ක් නර්තන කණ්ඩායම් සඳහා ඇතුලත් විය.

## ආගමික, සංස්කෘතික සහ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන

### ආගමික වැඩසටහන්





නිදහස් දින උත්සවය සැමරීම සහ විවිධ ප්‍රසංග පැවැත්වීම





ළමුන්ගේ දහම් අධ්‍යාපනය නැවීම, සංස්කෘතික සහ ආගමික කුසලතා ඇගයීම වෙනුවෙන් ත්‍යාග ලබාදීම





සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව සංවිධානය





භක්ති ගී තරගාවලි , දන්සල් හා ධර්ම දේශනා පින්කම් සංවිධානය





දහම් අධ්‍යාපනය ලබාදීම





ළමුන්ගේ හැකියාවන් හා කලා කුසලතාවයන් හඳුනා ගැනීමට පවත්වනු ලැබූ රසවින්දනාත්මක වැඩසටහන





ලෝක ජනාවාස දින සැමරුම වෙනුවෙන් පවත්වන ලද ළමා නර්ථන තරගාවලිය









# 2024 ලෝක ජනාවාස දිනය

ලෝක ජනාවාස දිනයේ ආරම්භය පිළිබඳව සොයා බැලීමේදී 1985 වසරේදී ජැමෙයිකාවේ කිංස්ටන් නගරයේදී පැවති එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසම සැසි වාරයේදී සිදුකරන ලද යෝජනාවකට අනුව 1986 වසරේ සිට සෑම වසරකම ඔක්තෝම්බර් මස පළමු සඳුදා දිනයේදී **"ලෝක ජනාවාස දිනය"** ජාත්‍යන්තර මට්ටමින් උත්සවාකාරයෙන් සමරනු ලබයි. ඒ අනුව මෙම වසරේදී ***"තුරුණු ජවයෙන් සපිරි නගරයක්"*** යන තේමාව යටතේ 38 වන ලෝක ජනාවාස දිනය සමරනු ලැබීය.

2010 වසරේ සිට මේ දක්වා මුල් අවදියේදී කොළඹ නාගරික බල ප්‍රදේශයත්, ඉන් අනතුරුව දිවයින පුරා ව්‍යාප්ත කරමින් දිස්ත්‍රික්ක 11 ක් ආවරණය වන පරිද්දෙන් අඩු පහසුකම් සහිත ප්‍රජාව සම්බන්ධ කරගනිමින් අඛණ්ඩව ලෝක ජනාවාස දින වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, ළමා සිතුවම් තරගාවලිය, ළමා නර්තන තරගාවලිය, ළමා කෙටි චිත්‍රපට තරගය, ව්‍යවසායකත්ව වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන, කුඩා කණ්ඩායම් සාමාජිකයන් සඳහා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව, සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගය, දෙමාපිය රැකවරණය අහිමි දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම, ළමා පුස්තකාලයක් ස්ථාපිත කිරීම සහ පොදු දේපල පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම වැනි වැඩසටහන් පවත්වනු ලැබීය.

ලෝක ජනාවාස දිනය තේමාකර ගනිමින් සෑම අවුරුද්දකම පවත්වන ළමා සිතුවම් තරගය එලෙසම 2024 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව,

- 6-9 වයස් කාණ්ඩය
- 10-14 වයස් කාණ්ඩය
- 15-18 වයස් කාණ්ඩය

යටතේ 2024 වර්ෂයේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ජනාවාසයන්හි ළමුන්ගේ සහභාගීත්වයෙන් ඉහත සඳහන් තරගාවලි පවත්වනු ලැබීය. පළමු අදියරේදී ළමුන් විසින් ඉදිරිපත් කරන ලද සිතුවම් 3500 ක් අතුරින් නිර්මාණාත්මක සිතුවම් 500 ක් දෙවන අදියර සඳහා තෝරා ගත් අතර, එම ළමුන් 500 දෙනාගේ සහභාගීත්වයෙන් දෙවන අදියරේ සිතුවම් තරගය ගම්පහ උඩුගම්පොල සෙනරත් පරණවිතාන ජාතික පාසලේදී පවත්වන ලදී. එහිදී 6-9 වයස් කාණ්ඩ සඳහා ***"ලස්සන නගරයක හෙට දවස, පහසුවයි ලස්සනයි එකතුවුනු නගරයයි, ගස්වැල් පිරි ලස්සන නගරයක්"*** නමින්ද 10-14 සහ 15-18 වයස් කාණ්ඩ සඳහා ***"නගර නැගුමට තරුණ දැක්ම, සොභාදහම සමග නගර ගොඩ නගමු, නගරයයි පරිසරයයි එකතු කරමු "*** යන මාතෘකා ඔස්සේ සිතුවම් නිර්මාණය කරන ලදී. මෙහිදී දරුවන් ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් මේ සඳහා ඉදිරිපත් වී සිතුවම් නිර්මාණය කරනු දැකීම විශේෂත්වයක් විය.

එසේම ළමුන්ගේ නිර්මාණාත්මක කුසලතා උපයෝගී කර ගනිමින් ***"තුරුණු ජවයෙන් සපිරි නගරයක්"*** යන තේමාව යටතේ ජංගම දුරකථනය භාවිතය කරමින් විනාඩි 5 ක නිර්මාණශීලී කෙටි චිත්‍රපට තරඟාවලියක් දියත් කළ අතර (එක් කණ්ඩායමක් සඳහා උපරිමය ළමුන් 11 දෙනෙක්) කණ්ඩායම් 10 ක් ළමුන් 100 දෙනෙකු පමණ ඒ සඳහා සහභාගිවිය. විශේෂයෙන් එය ක්‍රියාකාරි ළමා සමාජයන් හී සමාජිකයින්ගේ සහභාගිත්වය තුළින් සිදුකරන ලදි.

මේ සඳහා සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කොළඹ, ගම්පහ, මාතලේ, නුවරඑළිය, යන දිස්ත්‍රික්කයන්හි ජනාවසයන්ගෙන් කෙටි චිත්‍රපට ඉදිරිපත් විය. ළමා කෙටි චිත්‍රපට පිළිබඳ විශේෂ ප්‍රවීනත්වයක් සහිත විනිශ්චය මණ්ඩලයකගේ සහභාගිත්වය මත හොඳම නිර්මාණයන් 3ක් ජයග්‍රාහී කෙටි චිත්‍රපට ලෙස තෝරා ගැනීම සිදුකරන ලදී. මෙහිදී ජයග්‍රාහකයන් හට ත්‍යාග, සහතික හා කුසලාන පිරිනමනු ලැබීය.

කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායකයින් හඳුනාගැනීම, නව නිෂ්පාදන හඳුන්වාදීම, ඔවුන්ට මූල්‍ය ණය පහසුකම් සපයා දීම සහ වෙළඳපල අවස්ථාව හඳුන්වා දෙමින් නාගරික අඩුපහසුකම් සහිත ජනාවාසවල ප්‍රජාව ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය වැඩසටහන් ස්වයං රැකියා වැඩසටහන යටතේ ක්‍රියාවට නංවනු ලබයි. නිෂ්පාදන ආර්ථිකයක් අරමුණු කර ගනිමින් ලෝක ජනාවාස දිනයට සමගාමීව ව්‍යවසායකයින්ගේ විවිධ නිෂ්පාදන සඳහා වෙළඳපොල අවස්ථාව හඳුන්වා දීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

මෙම වැඩසටහන සඳහා ආහාර අංශය හා නිපැයුම් අංශය යන දෙඅංශයෙන්ම ව්‍යවසායකයින් 45 දෙනෙකු සහභාගී විය. විශේෂයෙන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් වලට සහභාගී වී අලුතින් නිෂ්පාදන ආරම්භ කල ව්‍යවසායකයින් සහ කරමින් පැවති ව්‍යාපාරය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට ප්‍රමුඛත්වය ලබාදීම මෙහි අරමුණයි.

කුඩා කණ්ඩායම් නිලධාරීන් සඳහා අභිප්‍රේරනාත්මක වැඩසටහනක් ලෝක ජනාවාස දිනට සමගාමීව පරිසර අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙහිදී කුඩා කණ්ඩායම් 15 ක නිලධාරීන් 52 සහභාගී වූ අතර, කුඩා කණ්ඩායම් තුල සිටින නිලධාරීන්ගේ මූල්‍ය විනය, ගිණුම් පවත්වාගෙන යාම, ප්‍රජා සහභාගීත්වය හා කණ්ඩායම් ක්‍රමයේ ප්‍රායෝගික දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම උදෙසා මෙම වැඩමුළුව පවත්වන ලදී. මේ සඳහා මොණරාගල, අනුරාධපුරය, ගාල්ල, කොළඹ, ගම්පහ, රත්නපුරය, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් හි ජනාවාස වලින් කුඩා කණ්ඩායම් නිලධාරීන් සහභාගී වන ලදී.

ලෝක ජනවස දිනය සැමරීම නිමිත්තෙන් නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස වල ජීවත් වන යෞවන යෞවනියන්ගේ ක්‍රීඩා කෞෂල්‍යා ඔප්නැන්වීම අරමුණු කරගනිමින් සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලදී. තරුණ තරුණියන් අතර කණ්ඩායම් හැඟීම, නායකත්වය හා ආකල්ප සංවර්ධනය තුලින් ඔවුන් මානව සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීය ලෙස දායක කර ගැනීම මෙම වැඩසටහන සිදු කිරීමේ මූලික අරමුණු විය.

එමෙන්ම නාගරික තරුණ කොටස් තුල වර්ධනය වන සමාජ විරෝධී ක්‍රියා අවම කිරීම හා ඔවුන් සමාජයට අත්‍යාවශ්‍ය පුද්ගලයන් බවට පත්කිරීම ද මෙම වැඩසටහන කිරීමේ අරමුණ වේ. කොළඹ දිස්ත්‍රික්කයේ පළමු වටයේ තරග කොළඹ ශාලිකා ක්‍රීඩාංගනයේ ද ගම්පහ දිස්ත්‍රික්කයේ පළමු වටයේ තරග ගම්පහ සෙනරත් පරණවිතාන ජාතික පාසලේදී ද පවත්වනු ලැබීය. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි දෙවන වටයේ තරග ගම්පහ සෙනරත් පරණවිතාන ජාතික පාසලේදී පවත්වා ඉන් ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලදි. මෙම සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පිරිමි හා කාන්තා ලෙස කාන්ඩ දෙකක් යටතේ තරග කරන ලදී. මෙහිදී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකම නියෝජනය කරමින් කාන්තා ක්‍රිකට් කණ්ඩායම් 05 ක් ද, කොළඹ නාගරික කලාපයෙන් පිරිමි ක්‍රිකට් කණ්ඩායම් 11 ක්ද, ගම්පහ දිස්ත්‍රික්කයෙන් පිරිමි කණ්ඩායම් 11 තරග කරන ලදී.

සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන නාගරික ජනාවාසයන්හි හා මහල් නිවාස සංකීර්ණයන්හි දෙමාපියන් අහිමි අඩු ආදායම්ලාභී පවුල්වල හඳුනාගත් ළමුන් 30 දෙනෙකුට ඔවුන්ගේ අඛණ්ඩ අධ්‍යාපන කටයුතු සඳහා සහයවීම හා ඔවුන්ගේ අනාගතයට අත්වැලක් සැපයීම වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල අඩංගු පාසල් බෑග් 30 ක් ලබා දෙන ලදී.

මහල් නිවාසවල පදිංචි වූ ප්‍රජාවට එම මහල් නිවාසවල පොදු දේපල ආරක්ෂා කරමින් එම පරිසරයට අනුගත වෙමින් ජීවත් වීමට අවශ්‍ය දැනුම ලබා දීම මෙන්ම නිසිලෙස ධනාත්මකව ඔවුන්ගේ ආකල්ප වර්ධන කිරීම වෙනුවෙන් කොළඹ නාගරික කලාපයේ මහල් නිවාස සංකීර්ණ 05 ක හා අගුලාන සයුරුපුර මහල් නිවාස සංකීර්ණයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් සිදු කරන ලදී. මහල් නිවාසවල

ජීවත්වීමේදී පිළිපැදිය යුතු නීති රීති පිලිබඳ ප්‍රජාව දැනුවත් කිරීම මෙම වැඩසටහනින් සිදු කෙරේ. මෙම දැනුවත් කිරීම සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධාරීන්ගේ හා මහල් නිවාස වලට අදාල ප්‍රජා පොලිස් නිලධාරීන්ගේ සම්පත් දායකත්වය ලබා ගන්න ලදී. මේ සඳහා මහල් නිවාස සංකීර්ණ 06 ක ප්‍රජාව 320 දෙනෙකු සම්බන්ධ විය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සම්බන්ධ වූ ප්‍රජාව වෙනුවෙන් පොදු දේපල පරිහරණය කිරීමට අදාල මාර්ගෝපදේශන අත්වැල නමින් පොතක් ලබා දෙන ලදී.

ලෝක ජනාවාස දිනයට සමගාමීව ළමා පුස්තකාලයක් ස්ථාපිත කිරීමට කටයුතු සූදානම් කල අතර, එය මට්ටක්කුලිය - මුවදොර උයන මහල් නිවාස සංකිරණයේ ළමා සමිතිය මූලික කර ගනිමින් “මුවදොර උයන අකුර” නමින් ස්ථාපිත කරන ලදි. මේ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා අධ්‍යයන අංශයේ මහාචාර්ය සුනේත්‍රා මහත්මියගේ සහභාගීත්වයෙන් සහ එම ප්‍රදේශයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ, ග්‍රාම නිලධාරි මහතාගේ, ග්‍රෑන්ඩ්පාස් පොලිස් නිලධාරින්ගේ, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (නිවාස) සහ අප ආයතනයේ නිලධාරීන්ගේ සහභාගීත්වය මේ සදහා ලැබුණි. මේ සඳහා ළමා සමිතියේ ළමුන් 94 දෙනෙකු සහභාගි වූ අතර, ප්‍රජා සමිතියේද සහයෝගය ලබාදෙන ලදි.

## 2024 ලෝක ජනාවාස දින ඡායාරූප

### ළමා සිතුවම් තරඟාවලිය









### කෙටි චිත්‍රපට තරඟාවලියේ විනිශ්චය කටයුතු





## ක්‍රීඩා කණ්ඩායම් වැඩමුළුව





## සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගය









## පොදු දේපල පරිහරණය පිලිබඳ දැනුවත් කිරීම





## මුවදොර උයන "අකුර" ළමා පුස්තකාලය ආරම්භ කිරීම





# ලෝක ජනාවාස ජාතික සැමරුම් උත්සවය - 2024

1985 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ජනාවාස දිනයේ 38 වන සංවත්සරය සමරමින් ග්‍රාමීය, නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම් ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මැතිතුමාගේ සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනෙහි ශ්‍රී ලංකා වැඩසටහන් කළමනාකරු හර්ෂනී හලංගොඩ මහත්මියගේ සහ අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ලෝක ජනාවාස දින ජාතික සැමරුම් උත්සවය පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි.

මෙහිදී ලෝක ජනාවාස දින සැමරුමට සමාගමීව පැවැත්වූ වැඩසටහන් අතුරින් දීප ව්‍යාප්තව පැවැත්වූ ළමා සිතුවම් තරගාවලිය, ළමා නර්තන තරගාවලිය, ළමා කෙටි චිත්‍රපට තරගය, ව්‍යවසායකත්ව ප්‍රවර්ධන අලෙවි සැල තරගයන් ලෙස පැවැත්වූ අතර, මෙම තරගයන්හි ජයග්‍රහනය කරන ලද දූදරුවන් සහ ප්‍රතිලාභීන් සඳහා මුදල් ත්‍යාග, සහතික පත් හා කුසලාන පිරිනැමීම සෙත්සිරිපාය 2 වන අදියර 11 වන මහලේ ශ්‍රවණාගාරයේදී 2024 ඔක්තෝම්බර් මස 07 වන සඳුදා දින අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.








# ප්‍රධාන කාර්යය දර්ශක

## භෞතික සංවර්ධන ව්‍යාපෘති

| ලුනාව ව්‍යාපෘතිය | (0.01) | (0.01) |
| නාවලපිටිය නිවාස ව්‍යාපෘතිය | 623,846.17 | 623,846.17 |
| තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය | 871,755.00 | 871,755.00 |
| අනුරාධපුර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 47,922.74 | 47,922.74 |
| අතුරුගිරිය මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය | 84,500.00 | 84,500.00 |
| කඩුවෙල නිවාස ව්‍යාපෘතිය | 1,176,830.10 | 1,176,830.10 |
| කළුතර පැපිලියාවත්ත ව්‍යාපෘතිය | 5,940.00 | 5,940.00 |
| ඕර්වඩ් වත්ත නිවාස ව්‍යාපෘතිය | 3,496,910.90 | 2,492,432.80 |
| ශ්‍රී ජයවර්ධනපුර නිවාස ව්‍යාපෘතිය | 2,014,232.72 | 1,894,232.72 |
| වැලිසර මිල්ලගහවත්ත නිවාස ව්‍යාපෘතිය | 10,928,882.59 | 8,528,507.59 |
| **එකතුව** | **25,998,793.04** | **22,473,939.94** |

*සටහන් - 13*

**උපචිත වියදම්**

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| සේ.අ.සා.අරමුදල | 1,393,551.58 | 1,198,617.78 |
| සේ.නි.භා.අරමුදල | 209,029.76 | 179,792.68 |
| උපචිත වියදම් (සේවා) | 10,000.00 | |
| ඉන්ධන වියදම් | 275,153.31 | 297,680.49 |
| නවාතැන් වියදම් | 11,583.00 | - |
| මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම් | 671,692.32 | 726,564.11 |
| නීති ගාස්තු | 3,000.00 | 6,000.00 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය | 434,831.43 | 2,999,464.37 |
| අතිකාල දීමනා | 327,470.83 | 458,750.75 |
| කාර්යාල කුලිය | 2,791,948.16 | 2,525,697.25 |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| වෙනත් දීමනාව | - | 5,000.00 |
| ණය අයකිරීම් වියදම් | - | 23,467.54 |
| වාහන (අලුත්වැඩියා සහ නඩත්තු වියදම්) | 1,834,600.00 | 73,262.23 |
| දුරකථන බිල්පත් ගාස්තු | 123,462.10 | 219,621.92 |
| ගමන් වියදම් | 36,440.10 | 17,789.10 |
| ස්වශක්ති මානවසංවර්ධන වැඩසටහන | - | 40,993.19 |
| විගණන ගාස්තු | 800,000.00 | 1,255,040.00 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු වැටුප් | 0.90 | 0.90 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 9,175.00 | 10,175.00 |
| ශ්‍රී වික්‍රමපුර උත්සව ශාලා වියදම් | - | 31,111.52 |
| ගමන් වියදම් - සංයුක්ත දීමනා - සේවක | - | 11,950.00 |
| ප්‍රවාහන දීමනා | 415,000.00 | 450,000.00 |
| ගමන් වියදම් - සංයුක්ත දීමනා - නිලධාරීන් සඳහා | - | 4,000.00 |
| කාර්යාල පිරිසිදු කිරීමේ වියදම් | 252,756.00 | 99,076.93 |
| නව ව්‍යාපෘති සංකල්ප සමාජගත කිරීමේ වියදම් | - | 340,393.51 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | - | 108,000.00 |
| උපයන විට ගෙවීම් බදු | 56,306.00 | 4,514.00 |
| මුද්‍රණ වියදම් | 84,880.00 | 144,100.00 |
| පරිගණක (අලුත්වැඩියාව සහ නඩත්තු වියදම්) | 43,213.00 | 81,910.00 |
| ව්‍යාපෘති පරිපාලන වියදම් | - | 2,464.45 |
| සමාජ සජීවීකරණ අංශයේ වියදම් | - | 22,900.00 |
| ශ්‍රී වික්‍රමපුර උත්සව ශාලා වියදම් | 15,500.00 | 4,474.91 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනාව (සේවක) | - | 4,000.00 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 1,145,207.29 | 103,500.00 |
| දුරකථන දීමනා - සේවක | 66,000.00 | 65,000.00 |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| පුහුණු වියදම් | - | 10,000.00 |
| පුහුණු දීමනා (පුහුණු සිසුන් සඳහා ) | 64,250.00 | 85,750.00 |
| සුභසාධක සංගමය | - | 37,770.00 |
| ලෝක ජනාවාස දින වැඩසටහන | 105,000.00 | 500,000.00 |
| බැංකු ණය | - | 50,000.00 |
| පොලී ආදායම - අඟුලාන කළමනාකරණ සංස්ථා අරමුදල | 7,177.48 | 15,110.47 |
| සමාජ සංවර්ධන වැඩසටහන | 52,284.80 | 551,000.00 |
| පොලී ආදායම ලුනාව කළමනාකරණ සංස්ථා අරමුදල | 206,394.65 | 50,097.53 |
| පොලී ආදායම සිංහපුර කළමනාකරණ සංස්ථා අරමුදල | 1,147.44 | 1,529.91 |
| පොලී ආදායම වදුල්ලවත්ත කළමනාකරණ සංස්ථා අරමුදල | 664,228.95 | 488,719.73 |
| වැටුප් හා වේතන | 115,917.30 | 147,324.28 |
| ඕර්වඩ්වත්ත වියදම් | 31,000.00 | 31,000.00 |
| පොලී මත රඳවා ගැනීමේ බදු | 2,448,791.73 | 1,901,362.40 |
| ලුනාව ජල ආරක්ෂණය | 16,595,520.00 | - |
| අඟුලාන නඩත්තු වියදම් | 1,331,602.36 | |
| අනුරාධපුර නඩත්තු වියදම් | 292,797.80 | |
| සන්නිවේදන වියදම් (ෆයිබර් සම්බන්ධතාවය) | 75,000.00 | |
| කාර්යාල උපකරණ (අලුත්වැඩියාව සහ නඩත්තු) වියදම් | 231,931.34 | |
| කාර්ය මණ්ඩල දිරි දීමනා වියදම් | 50,000.00 | |
| වෙබ් අඩවි (අලුත්වැඩියා හා නඩත්තු) වියදම් | 18,153.83 | |
| **එකතුව** | **33,301,998.46** | **15,384,976.95** |

**සටහන් - 14**

**කළමනාකරණ සංස්ථා අරමුදල**

| | | |
|---|---|---|
| කළමනාකරණ සංස්ථා අරමුදල | 14,514,000.00 | 14,514,000.00 |
| කළමනාකරණ සංස්ථා අරමුදල් ලුනාව ව්‍යාපෘතිය | 35,600,000.00 | 35,600,000.00 |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| කළමනාකරණ සංස්ථා අරමුදල් - සිංහපුර ව්‍යාපෘතිය | 2,671,854.45 | 2,671,854.45 |
| කළමනාකරණ සංස්ථා අරමුදල- වදුල්ලවත්ත ව්‍යාපෘතිය | 1,780,000.00 | 1,780,000.00 |
| **එකතුව** | **54,565,854.45** | **54,565,854.45** |

සටහන් - 15

. රඳවාගැනීමේ මුදල්

| | | |
|---|---|---|
| රඳවා ගැනීම්-අඟුලාන නඩත්තු | 5,012.50 | 35,370.00 |
| රඳවා ගැනීම් - ලුනාව Fire doors – ICC | 1,681,245.46 | 1,681,245.46 |
| රඳවා ගැනීම් - මධුෂාන් අයන් වර්ක් | 16,882.50 | 16,882.50 |
| රඳවා ගැනීම් - කාර්ය මණ්ඩල නිවාස ණය | 2,230,000.00 | - |
| රඳවා ගැනීම් - ගොඩනැගිලි අලුත්වැඩියා | 26,260.25 | 26,260.25 |
| රඳවා ගැනීම් - සම්පත් මධ්‍යස්ථාන | 0.44 | 16,220.50 |
| රඳවා ගැනීම් - තලවකැලේ | 0.05 | 19,783.55 |
| **එකතුව** | **3,959,401.20** | **1,810,762.26** |

සටහන් - 16

ගෙවිය යුතු දෑ

| | | |
|---|---|---|
| අනුරාධපුර ඔප්පු ගාස්තු | 11,275.00 | 11,275.00 |
| ආපදා ණය ගෙවීම් | 29,581.46 | - |
| පරිත්‍යාග සමාජ සජීවීකරණ වැඩසටහන | 2,985.00 | 26,940.00 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය | 41,709.99 | - |
| කාර්ය මණ්ඩල නිවාස ණය | 7,501.33 | - |
| ශ්‍රී වික්‍රමපුර ප්‍රජා ශාලාව | 14,000.00 | 4,000.00 |
| ටෙන්ඩර් තැම්පතු - නැවත ගෙවීම් | 10,000.00 | 10,000.00 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය - ඔප්පු ගාස්තු | 2,130,750.00 | |
| **එකතුව** | **2,247,802.78** | **52,215.00** |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| **සටහන් - 17** | | |
| **මූලික ගෙවීම** | | |
| තලවකැලේ නිවාස ව්‍යාපෘතිය | 5,000.00 | 5,000.00 |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය | 100,000.00 | 100,000.00 |
| තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය | 2,360,000.00 | - |
| එකතුව | **2,465,000.00** | **105,000.00** |
| **සටහන් - 18** | | |
| **වෙන් කිරීම්** | | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 37,928,137.50 | 29,637,547.00 |
| **සටහන් - 19** | | |
| **භාණ්ඩාගාර ප්‍රදාන** | | |
| ලුනාව නිවාස යෝජනා ක්‍රමය | 1,167,316,673.63 | 1,167,316,673.63 |
| එකතුව | **1,167,316,673.63** | **1,167,316,673.63** |
| **සටහන් - 20** | | |
| **රාජ්‍ය ප්‍රදාන** | | |
| ස්ථාවර වත්කම් සඳහා | - | - |
| **සටහන් - 21** | | |
| **රාජ්‍ය ප්‍රදාන** | | |
| සහස්පුර (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය | 16,421,345.26 | 16,421,345.26 |
| සිංහපුර (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය | 3,734,709.68 | 3,734,709.68 |
| වදුල්ලවත්ත (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය | 29,701,963.36 | 29,701,963.36 |
| ශ්‍රී ජයවර්ධනපුර | 287,500,000.00 | 287,500,000.00 |
| වැලිසර ඉඩම | 320,000,000.00 | 320,000,000.00 |
| සහස්පුර වාණිජ ඒකක | 44,777,000.00 | 44,777,000.00 |
| එකතුව | **702,135,018.30** | **702,135,018.30** |
| **සටහන් - 22** | | |
| **සංචිත** | | |
| ආපදා ණය සඳහා වෙන් කිරීම් | 15,000,000.00 | 15,000,000.00 |
| ආදායම් සංචිත | 36,625,000.00 | 36,625,000.00 |
| එකතුව | **51,625,000.00** | **51,625,000.00** |

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
මූල්‍ය කාර්යසාධන වාර්තාවේ සටහන්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

සටහන් - **23**

පොලී ආදායම

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| පොලී ආදායම් ඉතුරුම් (IPG) | 391.86 | 575.18 |
| පොලී ආදායම් අඟුලාන | 1,009,996.46 | 212,798.89 |
| පොලී ආදායම් ආපදා ණය | 648,396.00 | 627,026.05 |
| පොලී ආදායම් රජගම නිවාස ණය | 1,468,502.77 | 1,687,175.26 |
| පොලී ආදායම් සහස්පුර (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය | 387,169.30 | 551,428.48 |
| පොලී ආදායම් විසිරි නිවාස ව්‍යාපෘතිය | 44,421.67 | 344,701.06 |
| පොලී ආදායම් සිංහපුර (විකුණුම්) නිවාස ව්‍යාපෘතිය | | 15,804.00 |
| පොලී ආදායම් ස්වශක්ති ණය | 21,699.74 | 31,662.88 |
| පොලී ආදායම් තුරුඉතුරුගම | 1,943,403.16 | 1,816,002.46 |
| පොළී ආදායම් සේවක නිවාස ණය ව්‍යාපෘතිය | | 9,599.81 |
| පොළී ආදායම් වදුල්ලවත්ත | | 191,407.97 |
| පොලී ආදායම් ස්ථාවර තැන්පතුව | 136,773,791.73 | 223,313,217.37 |
| පොලී ආදායම් ඉතුරුම් ගිණුම | 154,191.65 | 589,450.03 |
| පොලී ආදායම් යතුරු පැදි ණය | 13,935.54 | |
| පොලී ආදායම් ලුනාව නිවාස ව්‍යාපෘතිය (කාර්ය මණ්ඩල) | 1,877,153.17 | |
| පොලී ආදායම් ලුනාව නිවාස ව්‍යාපෘතිය | 16,649,542.09 | 10,621,912.29 |
| පොලී ආදායම් කාර්ය මණ්ඩල නිවාස ණය | 397,691.56 | |
| පොලී ආදායම් සිංහපුර (පුනස්ථාපන) නිවාස ණය | | 90,966.76 |
| පොලී ආදායම් - තලවකැලේ (විකුණුම්) නිවාස ණය ව්‍යාපෘතිය | 563,677.92 | 257,995.14 |
| එකතුව | **161,953,964.62** | **240,361,723.63** |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| **සටහන් - 24** | | |
| **වෙනත් ආදායම්** | | |
| පරිපාලන සහ අනෙකුත් ගාස්තු - අනුරාධපුර නිවාස ව්‍යාපෘතිය | 60,280.00 | |
| වාණිජ ඒකක - ගිවිසුම් ගාස්තු | | 1,200.66 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය මූලික ගෙවීම් | | 6,000.00 |
| ලුනාව වෙනත් ආදායම් | | 15,607.30 |
| හඳුනා නොගත් සෘජු තැන්පතු ආදායම් | | 124,770.00 |
| වෙනත් ආදායම් - ඔර්වඩ්වත්ත | 108,958.00 | 125,240.00 |
| සහස්පුර ඔප්පු ගාස්තු | 11,300.00 | 23,000.00 |
| සිංහපුර බදු කුලි ආදායම් | | 120,000.00 |
| ශ්‍රී වික්‍රමපුර - ප්‍රජාශාලා ආදායම් | 141,250.00 | 91,800.00 |
| වෙනත් ආදායම් | 19.30 | 33,139.65 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 343,000.00 | 189,000.00 |
| දඩ මුදල් | | 674,346.67 |
| ටෙන්ඩර් තැම්පතු - ආපසු නොගෙවන | 326,000.00 | 34,500.00 |
| **එකතුව** | **990,807.30** | **1,438,604.28** |
| **සටහන් - 25** | | |
| **නිවාස ව්‍යාපෘති ලාභය** | | |
| තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය | | 3,472,852.10 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය | | 21,068,641.19 |
| | | **24,541,493.29** |
| **සටහන් - 26** | | |
| **භාණ්ඩ අපහරණයෙන් ලද ලාභය** | | |
| අපහරණ භාණ්ඩ විකුණුම් ආදායම | | **27,518.78** |

| <u>**අයිතම**</u> | <u>**2024 (රු.)**</u> | <u>**2023 (රු.)**</u> |
|---|---|---|
| **සටහන් - 27** | | |
| <u>**පුද්ගල වේතන**</u> | | |
| විගණන සහ කළමනාකරණ කමිටු දීමනා | 133,186.20 | 240,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා සහ අනෙකුත් වියදම් | 1,398,888.75 | 1,030,000.00 |
| අයවැය දීමනා | 6,600,546.61 | 7,276,908.67 |
| උපදේශන කමිටු දීමනා | 74,200.00 | 342,000.00 |
| ජීවන වියදම් දීමනා | 21,553,930.70 | 11,185,317.42 |
| සේවක අර්ථසාධක අරමුදල | 9,480,136.13 | 8,840,960.71 |
| සේවක භාරකාර අරමුදල | 2,370,033.79 | 2,210,240.05 |
| ඉන්ධන දීමනා | 2,665,816.24 | 3,676,053.34 |
| නිවාඩු දින වැටුප් | 1,302,968.40 | 1,460,866.29 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල හා වෙනත් දීමනා | 94,000.00 | 468,000.00 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,736,205.21 | 5,186,639.80 |
| වැටුප් හා වේතන | 57,420,011.61 | 61,875,946.66 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා - සේවක | 88,000.00 | 46,000.00 |
| සේවක වන්දි මුදල් | | 192,500.00 |
| පාරිතෝෂිත ගෙවීම් | 2,400,000.00 | 2,900,000.00 |
| දුරකතන දීමනා - නිලධාරීන් සඳහා | 611,831.45 | 686,575.00 |
| දුරකතන දීමනා - සේවක | 829,000.00 | 791,000.00 |
| පුහුණු දීමනා | 1,189,500.00 | 1,326,500.00 |
| ප්‍රවාහන දීමනා | 5,129,420.83 | 6,840,000.00 |
| නිල ඇඳුම් දීමනා | 277,950.00 | 241,800.00 |
| වාහන දීමනා | 1,296,666.67 | 651,666.66 |
| සුභසාධන | 1,778,754.00 | 2,271,200.00 |
| | **121,431,046.59** | **119,740,174.60** |

| <u>අයිතම</u><br>සටහන් - 28<br><u>ගමන් වියදම්</u> | **<u>2024 (රු.)</u>** | **<u>2023 (රු.)</u>** |
|---|---|---|
| දේශීය - සංයුක්ත දීමනා (නිලධාරීන් සඳහා) | 28,840.00 | 508,153.50 |
| දේශීය - සංයුක්ත දීමනා (සේවක) | 912,857.00 | 690,575.00 |
| දේශීය - ගමන් වියදම් (බටා) | 340,972.38 | 379,897.00 |
| | **1,282,669.38** | **1,578,625.50** |

සටහන් - 29
<u>සැපයීම්</u>

| | | |
|---|---|---|
| ඉන්ධන | 8,904,389.31 | 6,848,661.32 |
| වෙනත් සැපයුම් වියදම් | 190,237.87 | 202,314.78 |
| මුද්දර | 159,370.00 | 1,135,335.00 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 6,598,480.70 | 6,324,474.65 |
| එකතුව | **15,852,477.88** | **14,510,785.75** |

*සටහන් - 30*
<u>සේවා</u>

| | | |
|---|---|---|
| නවාතැන් වියදම් | 129,423.00 | |
| ප්‍රචාරණ /ප්‍රදර්ශන වියදම් | 506,515.00 | 1,362,843.25 |
| විගණන ගාස්තුව | 800,000.00 | 800,000.00 |
| බැංකු ගාස්තු | 6,340.00 | 6,860.00 |
| බැංකු ගාස්තු (IPG) | 54,243.75 | 57,286.25 |
| කාර්යාල පිරිසිදු කිරීමේ ගාස්තු | 2,792,896.60 | 1,188,923.16 |
| උත්සව/කාර්ය වියදම් | 31,749.38 | |
| වාහන සඳහා මෙහෙයුම් කල්බදු/ කුලී ගෙවීම් | 7,298,350.44 | 6,954,256.59 |
| නීති වියදම් | 906,464.00 | 338,676.38 |
| රැස්වීම් වියදම් | 204,267.21 | 449,058.00 |
| කාර්යාල කුලී | 29,961,163.08 | 26,766,152.16 |
| වෙනත් වියදම් (සේවා) | 125,021.44 | 86,763.00 |
| මුද්‍රණ ගාස්තු | 613,489.50 | 585,308.33 |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| ණය අයකිරීම් වියදම් | 233,563.64 | 310,972.42 |
| ආරක්ෂක වියදම් | | 33,500.00 |
| පරිපාලන වියදම් - ව්‍යාපෘතිය | 8,696.89 | 10,780.15 |
| සමාජ සජීවීකරණ/ අනෙකුත් අංශ සේවක වියදම් | 211,381.88 | 326,750.00 |
| ශ්‍රී වික්‍රමපුර උත්සව ශාලා වියදම් | 263,109.42 | 570,195.94 |
| සන්නිවේදනය (දුරකථන ගාස්තු) | 1,371,768.00 | 1,292,917.49 |
| පුහුණු වියදම් (සේවක) | 428,333.00 | 932,050.00 |
| ප්‍රවාහන වියදම් | 181,348.36 | 348,637.94 |
| **එකතුව** | **46,128,124.59** | **42,421,931.06** |

*සටහන් - 31*
නඩත්තු වියදම්

| | | |
|---|---|---|
| මෝටර් රථ/ වෙනත් රක්ෂණ | 517,398.95 | 871,933.26 |
| ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය | 72,000.00 | 72,000.00 |
| ලී බඩු සහ සවිකිරීම් | 16,975.00 | |
| පරිගණක | 718,379.02 | 567,123.28 |
| කාර්යාල උපකරණ | 2,152,996.32 | 2,382,403.88 |
| වාහන | 9,155,811.58 | 8,259,807.23 |
| ලී බඩු සහ සවිකිරීම් | 22,400.00 | 69,700.00 |
| කාර්යාල ගොඩනැගිලි | | 130,910.00 |
| වෙබ් සහ අනෙකුත් සන්නිවේදන පහසුකම් | 199,690.47 | |
| **එකතුව** | **12,855,651.34** | **12,353,877.65** |

*සටහන් - 32*
වෙනත් පුනරාවර්තන වියදම්

| | | |
|---|---|---|
| අපහරණ භාණ්ඩ විකුණුම් | | (91,116.20) |
| අඩමාණ ණය වෙන් කිරීම් | 943,485.47 | 13,066,468.63 |
| පාරිතෝෂිත | 9,989,425.50 | 2,931,497.00 |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| රඳවා ගැනීමේ බදු | 6,854,043.04 | 9,276,675.66 |
| **එකතුව** | **17,786,954.01** | **25,183,525.09** |

*සටහන් - 33*

**හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන | 3,063,911.54 | 29,769,347.71 |
| ඉඩම් බැහැර කිරීම - අනුරාධපුර | (230,000.00) | |
| ප්‍රත්‍යාගණනය කිරීම - ඕර්වඩ්වත්ත | 86,000,000.00 | |
| **එකතුව** | **88,833,911.54** | 29,769,347.71 |

*සටහන් - 34*

**හුවමාරු වන ගනුදෙනුවෙන් ලැබෙන ආදායම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන - හුවමාරු වන | | 3,000,000.00 |
| **එකතුව** | | **3,000,000.00** |

*සටහන් - 35*

**ප්‍රාග්ධන වියදම්**

**ස්ථාවර වත්කම් ක්ෂය**

| | | |
|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 2,090,487.71 | 884,214.78 |
| පරිගණක | 1,006,732.59 | 1,761,745.33 |
| රියදුරු විවේකාගාරය | 35,640.00 | 35,640.00 |
| අස්පෘශ්‍ය වත්කම් | 125,000.00 | 125,000.00 |
| කාර්යාල උපකරණ | 1,978,062.20 | 1,592,197.14 |
| ගබඩා කාමරය | 68,850.00 | 68,850.00 |
| වාහන | 9,940,000.00 | 9,940,000.00 |
| ගොඩනැගිලි - අනුරාධපුර | 245,160.13 | 245,160.13 |
| **එකතුව** | **15,489,932.63** | **14,652,807.38** |

| අයිතම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| ***සටහන් - 36*** | | |
| **සංවර්ධන වියදම්** | | |
| අඟුලාන නිවාස ව්‍යාපෘති - නඩත්තු | 3,590,733.32 | 1,005,535.57 |
| අනුරාධපුර නිවාස ව්‍යාපෘති - නඩත්තු | 292,797.80 | |
| නව ව්‍යාපෘති සංකල්ප සමාජගත කිරීම | 229,400.00 | 769,388.51 |
| ලෝක ජනාවාස දින වැඩසටහන | 4,272,380.06 | 1,954,611.50 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය - නඩත්තු | 2,661,290.00 | 16,000.00 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය - ජල ආරක්ෂණ | 16,595,520.00 | |
| සහස්පුර නිවාස ව්‍යාපෘතිය - නඩත්තු | 139,970.00 | |
| මහන මැෂින් - නඩත්තු වියදම් | | 6,000.00 |
| සිංහපුර නිවාස ව්‍යාපෘති - නඩත්තු | 162,805.00 | 118,600.00 |
| සමාජ සංවර්ධන වැඩසටහන | 6,194,601.70 | 4,362,746.50 |
| තලවකැලේ නිවාස ව්‍යාපෘති - නඩත්තු | | 1,374,676.00 |
| **එකතුව** | **34,139,497.88** | **9,607,558.08** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එච්යූඩී/ඒ/යූඑස්ඩීඒ/එෆ්/24/01 ; ඔබේ අංකය / உமது இல. / Your No : ; දිනය / திகதி : 2025 අප්‍රේල් 24 දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ (අධිකාරිය) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 28 ඡේදය ප්‍රකාරව භාණ්ඩ විකිණීමෙන් වන ආදායමරය හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු කොනදේසි 05 සම්පූර්ණ වීමෙන් අනතුරුව ආදායම හඳුනාගත යුතු වුවද, ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාස විවිධ ක්‍රම යටතේ බෙදා කර තිබූ අතර ඒ එක් එක් අවස්ථාවේදී ආදායම හඳුනාගෙන තිබූ බැවින් අධිකාරිය විසින් මෙම නිවාස බෙදා කිරීමේදී විකුණුම් අවස්ථාව හඳුනා ගැනීමට නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුකූල නොවන ලෙස, 2023 වර්ෂයේදී රු. මිලියන 60 කට ගිණුම්ගත කර තිබුණු රු. මිලියන 120 ක සාධාරණ වටිනාකමක් සහිත නිවටුඹුව ඕර්චඩ් වත්ත, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 146 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර එහි ප්‍රත්‍යාගණිත ලාභය වූ රු. මිලියන 26 ක් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කිරීම වෙනුවට ප්‍රමිතයේ 46 ඡේදයට අනුකූල නොවන පරිදි හුවමාරු නොවන ගණුදෙනු වලින් ලද ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර ප්‍රමිතයේ 45 ඡේදයට අනුකූල වන පරිදි හුවමාරු නොවන ගණුදෙනුවලින් ආදායම හඳුනා නොගෙන, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධිකාරිය වෙත ලැබී තිබූ රු. මිලියන 652.3 ක් වටිනා ඉඩම් රාජ්‍ය ප්‍රදාන යටතේ දක්වා තිබීම හේතුවෙන් රාජ්‍ය ප්‍රදාන එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 14 දින නිදහස් දීමනාවක් ලෙස අධිකාරිය වෙත ලැබී තිබුණු 2012 දෙසැම්බර් 21 දිනට රජයේ තක්සේරු වටිනාකම රු. මිලියන 102 ක් වූ ලුනාව ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුකූලවන පරිදි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) අධිකාරිය වෙත වාණිජ අරමුණු වෙනුවෙන් ලැබී තිබූ රු. මිලියන 380 ක් වූ නිවටුඹුව ඕර්චඩ් වත්ත සහ වැලිසර මිල්ලගහවත්ත ඉඩම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 07 ඡේදය ප්‍රකාරව ආයෝජිත දේපළ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආයෝජිත දේපළ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූල වන පරිදි ඇගයීම් නොකර රු. මිලියන 9.99 ක සේවක පාරිතෝෂික වියදම් සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන තිබුණු බැවින් මෙම වටිනාකම සම්බන්ධයෙන් හා එයට අදාළව හඳුනාගෙන තිබූ රු. මිලියන 37.93 ක් වූ ජංගම නොවන වගකීමෙහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකිවිය.

(ඊ) 2024 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ගිණුම් 18 ක ශේෂය හා විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛනයේ ශේෂය අතර රු. මිලියන 15.46 ක වෙනසක් නිරීක්ෂණය විය.

2

(ඪ) අනුරාධපුර කටුකැලියාව "තුරුඉතුරුගම" ජනාවාස ව්‍යාපෘතියට අදාල ඉඩම් කොටස් 06 ක තක්සේරු වටිනාකම වූ රු. මිලියන 1.43 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගිණුම්ගත කර නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියේ නිවාස 02 ක් 2024 වර්ෂයේදී විකුණා තිබුණු නමුත් එහි වටිනාකම වූ රු. මිලියන 2.36 ක් අදාල වත්කම් ගිණුමෙන් ඉවත් කිරීම වෙනුවට ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඬ) ලුනාව නිවාස ව්‍යාපෘතියේ 2023 වර්ෂයේදී සිදු කරන ලද ඉදිකිරීම් කටයුතු වලට අදාලව ව්‍යාපෘති කළමණාකරු විසින් 2024 වර්ෂයේදී ගෙවිය යුතු ලෙසට සහතික කර තිබූ රු. මිලියන 14.03 ක බිල්පතක් සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් යටතේ ගිණුම් තැබීමට හෝ හෙලිදරව් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ඵ) ලුනාව නිවාස ව්‍යාපෘතියට අදාළ නිවාස විකිණීමෙන් ලැබෙන ආදායමින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ප්‍රතිපාදන නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූර්ණය කළ යුතු බවට 2020 දෙසැම්බර් 22 දිනැති අංක අමප/20/1844/306/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා තිබුණද භාණ්ඩාගාරය වෙතින් එම ව්‍යාපෘතිය වෙත ලබාදුන් රු. මිලියන 1,267න් මේ දක්වා නොගෙවූ රු. මිලියන 1,167 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස නොපෙන්වා හිමිකම් හා සංචිත යටතේ දැක්වීමෙන් හිමිකම් හා සංචිත එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඒ) අධිකාරිය විසින් අභ්‍යාන මහල් නිවාස සංකීර්ණයෙහි සිදුකරන ලද විදුලි සෝපාන අළුත්වැඩියා වෙනුවෙන් ඝායා කළමනාකරණ සංස්ථාවෙන් ලැබිය යුතු රු. මිලියන 1.61 ක් අනුචිතව නඩත්තු වියදම් ලෙස ගිණුම් ගත කිරීමෙන් ආයතනයේ වියදම් එම වටිනාකමින් වැඩියෙන් හා ලැබිය යුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ලී බඩු උපකරණ ක්ෂය වටිනාකම රු. මිලියන 0.899 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ එය රු. මිලියන 2.090 ක් ලෙස දක්වා තිබුණු බැවින් වර්ෂයේ ක්ෂය වියදම රු. මිලියන 1.191 කින් අධිගණනය වී අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

3

## 1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මා වෙත ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ හැකි නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේනම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ)(i)(iii), (ඈ) හා (ඉ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති / විධානයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියත්මක කරන බවට සහතික වීම සඳහා මෙම අධිකාරිය ස්ථාපනය කර තිබුණද, පිහිටුවා වර්ෂ 17 ක් ගතවුවද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය නොහැකි වී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1.2. සහ 13.4 ඡේද | වැඩ බැලීමේ පත්වීම සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියාට අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා සුදුසුකම් තිබිය යුතු වුවද, 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ (ඉංජිනේරු), සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) සහ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) යන තනතුරු සඳහා අදාල සුදුසුකම් නොමැති නිලධාරීන් වැඩ බැලීමට පත්කර තිබුණි. එසේම 2023 පෙබරවාරි 21 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 02/2023/12 මගින් තනතුරු සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති ඉහත නිලධාරීන්ම එම තනතුරුවල ස්ථිර කර තිබුණු අතර 2024 |

7

වර්ෂයේද සුදුසුකම් නොමැති එම නිලධාරීන් අදාළ තනතුරු වල රාජකාරී ඉටුකර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සැලසුම් කිරීමේ හා ගොඩනැගීමේ (Design and Build) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ මොරටුව ලුනාව නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කර මාස 06 ක් ඉකුත් වීමත් සමගම එම නිවාස වල බිත්තිවලින් ජලය කාන්දු වන බවට ලැබූ පැමිණිලි මත එම නවීකරණ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම නිවාස විකුණූ මුදලින් රු. මිලියන 41.38ක් ලබා ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. එසේ වුවද නවීකරණ කටයුතු මේ දක්වා සිදුකර අවසන් වී නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් හා ව්‍යාපෘති කළමණාකරු වූ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙන් මෙම දෝෂයන් සඳහා කිසිදු මුදලක් අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති කළමණාකරු වෙත මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 6.43 ක්ද අධිකාරිය විසින් ගෙවීම් කර තිබුණි.

**2.3 වෙනත් කරුණු**

(අ) ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන් නොවීම හා සභාධිපත්‍ය සහතික ලබාගැනීම ප්‍රමාදවීම මත සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ පුනස්ථාපන පදනම සහ විකුණුම් පදනම මත ඉදිකරන ලද නිවාස ඒකක 1719 කින් නිවාස ඒකක 1115 ක් සඳහා නිවාස හිමියන් වෙත ඔප්පු ලබාදීම සිදුකර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 22 දිනැති අමප/20/1844/306/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමට සියයට 20 ක අගයක් එකතු කර විකුණුම් මිල තීරණය කර නිවාස ඒකක බැහැර කළ යුතු වුවද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අනුව නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර අධිකාරියේ නිලධාරීන් 24 දෙනෙකු සඳහා නිවාස ලබා දීම හේතුවෙන් රජයට රු. මිලියන 20.68 ක මුදලක් අහිමි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට

8

අධිකාරියේ කාර්ය මණ්ඩලයට විකුණන ලද නිවාස ඒකක වලින් රු. මිලියන 92.09 ක් අධිකාරියට ලැබිය යුතුව තිබුණි.

(ඇ) ධීවර ජනතාව වෙනුවෙන් ඉදිකළ අහුලාන මහල් නිවාස ක්‍රමයෙන් සිනමා ශිල්පීන්ට හා ක්‍රීඩකයන්ට මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් රු. මිලියන 62.87 ක් වටිනා නිවාස ඒකක 53 ක භුක්තිය ලබා දී තිබුණද 2019 ඔක්තෝබර් 16 දිනැති අංක අමප/19/2761/122085 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සාධාරණ මුදලක් එම ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට නියමකර තිබුණි. එසේ වුවද මෙම නිවාස ඒකක 38 කින් රු. මිලියන 2.08 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව පැවතුණි. 2022 ඔක්තෝබර් 04 දිනැති අංක USDA/LEG/LG/06/15-1 දරන නීතිපතිතුමාගේ ලිපියෙහි උපදෙස් පරිදි නිදහස් දීමනා අවලංගු කිරීමට කටයුතු කර තිබුණු අතර තවදුරටත් නිවාස 12 ක් සඳහා නඩු පැවරීමට ද කටයුතු කරමින් පැවතුණි.

(ඈ) අධිකාරිය සතුව පැවති පෞද්ගලික සමාගමක් විසින් ඉදිකරනු ලැබූ රු. මිලියන 44.78 ක් වටිනා සහස්පුර වාණිජ ඒකක 67 ක් හා වටිනාකම හඳුනාගෙන නොතිබූ සේවා ඒකක 57 ක් බදු දීමෙන් අධිකාරිය වෙත බදු ආදායම් උපයාගත හැකිව තිබුණද, නිදහස් දීමනාවක් මත සභාධිපත්‍ය කළමණාකරන අධිකාරිය යටතේ ඇති කළමණාකරන සංස්ථාවකට බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තීරණය කිරීම හේතුවෙන් එම බදු ආදායම් මෙම අධිකාරියට අහිමි වී තිබුණි.

(ඉ) 2020 දෙසැම්බර් 22 දිනැති අමප/20/1844/306/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, රු. මිලියන 9.3 ක් වටිනා ලුනාව නිවාස ක්‍රමයේ නිවාස ඒකක තුනක විකුණුම් මිල ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමකින් තොරව එම නිවාසවල භුක්තියද බාරදී තිබුණි.

(ඊ) ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) විසින් අනුරාධපුර සුධාරක තාක්ෂණය යටතේ රු. මිලියන 4.9 ක් වැය කර ඉදි කළ නිවාස 06 පිළිබඳ 2022 නොවැම්බර් 19 වන දින ලබා දුන් වාර්තාවට අනුව මෙම නිවාස මිනිස් වාසයට නුසුදුසු බව සඳහන් කර තිබූ අතර එම කරුණ අධිකාරියේ ඉංජිනේරු මහතකු විසින් ද 2022 දෙසැම්බර් 20 වන දින සහතික කර තිබුණි. එසේ තිබියදී මින් නිවාස 02 ක් තම භාවිතයට ගත හැකි පරිදි ප්‍රතිසංස්කරණය කර ගැනීමේ කොන්දේසියට යටත්ව බාහිර පාර්ශවයක් වෙත බැහැර කර තිබූ අතර ඉතිරි නිවාස 04 වසර 12 ක් පුරා ඌන උපයෝජිතව පැවතුණි.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය පිළිවෙළින් 151 ක් හා 29 ක් වූ අතර එදිනට තථ්‍ය ස්ථිර හා කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය පිළිවෙළින් 101 ක් හා 08 ක් විය. ඒ අනුව ස්ථිර කාර්යය මණ්ඩලයේ හා කොන්ත්‍රාත් කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිළිවෙළින් 50 ක් හා 21 ක් වුවද අධිකාරියේ වර්තමාන කාර්යයන්ට අදාලව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ අත්‍යවශ්‍ය සේවකයින් බඳවා ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

9

(ඉ) 2024 කාර්යසාධන වාර්තාවට අනුව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය යටතේ ක්‍රියාත්මක වන අධිකාරියෙහි මධ්‍ය ආදායම් නිවාස ව්‍යාපෘති වල මූලික වැඩ යටතට අයත් වන ව්‍යාපෘති පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනා ගැනීම 2024 දෙසැම්බර් වන විට සියයට 100 ක ප්‍රගතියක් ළගා කර ගැනීමට අපේක්ෂා කර තිබුනද 2024 වර්ෂය අවසානයට කිසිදු භෞතික හෝ මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.

(ii) 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සිංහපුර, තලවතුගොඩ, කඩුවෙල සහ අතුරුගිරිය යන නිවාස ව්‍යාපෘතින්හි මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු කිසිදු කාර්යයක් වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) අනුරාධපුර තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ නිම කිරීමට අපේක්ෂාකල කාර්යයන් 5 ක් 2024 වර්ෂය දක්වා නිමකර නොතිබුණි.

(iv) අභ්‍යන්තර ඉපයීම් මගින් වෙන් කරන ලද රු. මිලියන 1.10 ක වටිනාකමින් 2024 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂිත වූ තලවාකැලේ නිවාස ව්‍යාපෘතියේ ජල පවාහන පද්ධතිය ඉදිකිරීමට හා නිවාස අලුත් වැඩියාවට අදාල කාර්යයන්හි කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.

(v) හලාවත නිවාස ව්‍යාපෘතියේ පළමු අදියෙරහි නිවාස අළුත්වැඩියාව හා ඔප්පු ලබා දීමේ කටයුතු වෙනුවෙන් රු. මිලියන 4.27 ක් වෙන කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 0.004 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණ අතර කිසිදු මූල්‍ය ප්‍රගතියක් නිරීක්ෂණය නොවිය.

(ඊ) අධිකාරිය විසින් පුනස්ථාපන පදනම (Re – location) පදනම හා විකුණුම් පදනම මත ලබාදී ඇති නිවාස වලින් සහ ලබාදී ඇති අනෙකුත් ණය වලින් වාරික මුදල් අය කර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පවතින පව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණ විය.

(i) අධිකාරිය විසින් පුනස්ථාපන පදනම මත ලබා දුන් නිවාස ව්‍යාපෘති 07 කට අදාළ නිවාස 399 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ණය වාරික වටිනාකම රු. මිලියන 114.86 ක් වූ අතර ඒ තුළ වසර 3-5 අතර කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 38.32 ද වසර 05 ඉක්ම වූ අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 48.07 ක් ද විය. එම ශේෂයන් මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 33 ක් හා සියයට 42 ක් විම.

(ii) අධිකාරිය විසින් විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ව්‍යාපෘති 09 කට අදාළව නිවාස 227 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ණය වාරික වටිනාකම රු. මිලියන 72ක් වූ අතර ඒ තුළ වසර 2 - 5 අතර කාලයක සිට අයවිය යුතු රු. මිලියන 22.42 ක් ද වසර 5 ඉක්ම වූ රු. මිලියන 27.78 ක් ද විය. එම ශේෂයන් මුළු ණය වාරික වටිනාකමින් පිළිවෙලින් සියයට 31 ක් හා සියයට 39 ක් විම.

(iii) ලූනාව නිවාස ඒකක බැහැර කිරීමේදී මූලික ගෙවීම ලෙස නිවසක මුළු වටිනාකමින් සියයට 25 ක් අධිකාරියට අයකර ගැනීමටත් ඉතිරි සියයට 75 සඳහා රාජ්‍ය බැංකුවක් සමඟ සම්බන්ධ වී වසර 25 ක් තුළ ගෙවීමේ ණය පහසුකම ප්‍රතිලාභීන් වෙත සලසා දීම හා එම සියයට 25 ක මුදල මාස 3 ක් ඇතුළත අධිකාරියට අයකර ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය තිරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වුවද 2021 අප්‍රේල් 09 දින ජනතා අයිතියට පත්කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට නිවාස ලාභීන් විසින් 177 දෙනෙකුගෙන් පමණක් සම්පූර්ණ නිවාස වටිනාකම ලැබී තිබුණු අතර නිවාස ලාභීන් 179 කින් අයවිය යුතු වටිනාකම රු.මිලියන 473.02 ක් වීම.

ජී. එච්. ඩී. ධර්මපාල

විගණකාධිපති (වැ.බ)



නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
**நகரக் குடியிருப்பு அபிவிருத்தி அதிகாரசபை**
**Urban Settlement Development Authority**